www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# 2004 ඇමරිකා එක්සත් ජනපදයේ ජනාධිපතිවරනයේ දී සමාජවාදී සමානතා පක්ෂයට ආධාර කරන්න

**රැකියා, අධ්‍යාපනය, සෞඛ්‍ය සේවා සඳහා සමාජවාදී වැඩපිළිවෙලක්!**

**ඉරාකයේ යුද්ධය අවසන් කරනු!**

**සියලු එක්සත් ජනපද හමුදා ඉවත් කර ගනු!**

**Support the Socialist Equality Party in the 2004 US elections**

**සමාජවාදී**
**2004 සැප්තැම්බර් 20**

2004 ඡන්ද විමසීමේ දී ස්වාධීන සමාජවාදී ව්‍යායාමයට සහාය දෙන ලෙස එක්සත් ජනපදය පුරාම වැඩ කරන ජනතාවන් ද තරුන ජනයා ද කැඳවා සිටී. එම පක්ෂය ජනාධිපති ධුරය සඳහා බිල් වැන් ඕකන් ද උප ජනාධිපති ධුරය සඳහා ජිම් ලෝරන්ස් ද, කොන්ග්‍රස් සහ ප්‍රාන්ත නීති සම්පාදක මන්ත්‍රී මන්ඩල සඳහා වෙනත් අපේක්ෂකයන් ද ඉදිරිපත් කර සිටින්නේ වැඩ කරන ජනතාවට දේශපාලන විකල්පයක් සපයා දීමට ද ඔවුන් ඡන්දය විමසීමෙන් පසුව අනිවාර්යයෙන් ම එළඹෙනු ඇති අරගලවලට සූදානම් කිරීම සඳහා ද වේ.

2004 ඡන්ද විමසීමේ ව්‍යායාමයේ අවසාන අවධීන් මත ආධිපත්‍යය දරා සිටින්නේ ඉරාකයේ යුද්ධයේ ලේවැකි උග්‍රවීම ද එක්සත් ජනපද ආර්ථිකයේ ගැඹුරුවන්නා වූ පරිහානිය ද වේ. ඉරාකයේ මැරුම් කෑ ඇමරිකානු සොල්දාදුවන්ගේ සංඛ්‍යාව 1000 ඉක්මවා ගොස් තිබේ. මරන ලද ඉරාක ජනතාවගේ සංඛ්‍යාව දසදහස් ගනනින් ඉහල ගොස් තිබේ. ඉරාක ජනතාව යටත් කර ගැනීම සඳහා ද ඇමරිකානු තෙල් හා මූල්‍ය අවශ්‍යතාවන්ට යටත් වූ යටත් විජිත රූකඩ පාලනයක් පිලිගැනීමට ඔවුන්ට බලකිරීම සඳහා ද එක්සත් ජනපද මිලිටරිය ම්ලේච්ඡ ප්‍රචන්ඩත්වය සහ ත්‍රස්තය යොදා ගන්නා තතු තුල, "ඉරාක නිදහස" නමින් බුෂ් ක්‍රියාත්මක කල මෙහෙයුම මහා මිනීමරු මෙහෙයුමක් බවට රූපාන්තරනය වී ඇත. මේ සමග ම එක්සත් ජනපදය තුල බෙහෙවින් වගවර්නනා කරනු ලැබූ "ආර්ථික සුවවීම" තවත් ප්‍රචාරක මිථ්‍යාවක් ලෙස එළිදරව් කරනු ලැබ තිබේ. රැකියා, විශ්‍රාම වැටුප් සහ සෞඛ්‍ය පහසුකම් කපා දමා ලාභ තරකර ගැනීමට මහ සංගතයන්ගේ ධාවනය අඩු වන බවක් පෙන්නුම් නො කරයි.

2004 ඡන්ද විමසීම බුෂ් පාලනාධිකාරය ඉවත් කොට, එහි පිලිවෙත් පිලිකෙව් කොට, පිටරට ද සියරට තුල ද සැබැවින් ම වෙනස් ගමන් දිශාවක් පෙන්නුම් කිරීමට කැප වුනු ආන්ඩුවක් බලයට ගෙන ඒමට ඉඩකඩ සලසතැ යි අපේක්ෂා කල මිලියන ගනන් ඇමරිකානු වැඩ කරන ජනතාවට මෙම මැතිවරන ව්‍යායාමයේ වර්ධනය විසින් ගෙන දී ඇත්තේ කම්පනයකි. ඩිමොක්‍රටික් පක්ෂය ද එහි ජනාධිපති අපේක්ෂක කෙරී ද බුෂ් පාලනාධිකාරයට අර්ථභාරී විකල්ප දිශාවනතියක් සපයන්නේ නැතැ යි එන්න එන්නම වැඩිවැඩියෙන් පැහැදිලි වී තිබේ. කෙරීගේ ව්‍යායාමයේ ශෝචනීය ස්වභාවය - රිපබ්ලිකානුවන් විසින් එල්ල කරනු ලබන ප්‍රහාර මැද්දේ කෙරීගේ බියගුලු හා යටත් වන පලායාම - පෙන්නුම් කරන්නේ හුදෙක් ඩිමොක්‍රැටික් අපේක්ෂකයාගේ පෞද්ගලික දුබලකම පමනක් නො වේ. එය මහාසංගත ඇමරිකාවේ දේශපාලන පක්ෂ දෙක අතර සාරගර්භ වෙනස්කම් නො පවත්නා බව ද විදහා දක්වයි.

කෙරී ජනාධිපතිවරනය දිනුවත්, එක්සත් ජනපදය විසින් ඉරාකය අල්ලාගෙන සිටීම දිගින් දිගටම කෙරනු ඇත. "පූර්වභංග" යුද්ධය පිලිබඳ ධර්මය බලයේ රැඳෙනු ඇත. තවදුර යුද්ධ ක්‍රියාවන් යුක්ති යුක්ත කිරීම සඳහා පාවිච්චි කෙරනු ඇත. එක්සත් ජනපදය තුල කෙරී තෝරා පත් කිරීම ත්‍රස්තවාදයට විරුද්ධව සටන් කිරීමේ මුවාවෙන් පොලිස්-රාජ්‍ය පියවර ඉදිරියට ගෙන ඒම නවතා ලනු නැත; කම්කරුවන්ගේ රැකියා සහ ජීවන තත්වයන්ට එරෙහි මහ සංගත-නීත ප්‍රහාරයන් දිගින් දිගටම පවතිනු ඇත. ඩිමොක්‍රටික් සහ රිපබ්ලිකන් පක්ෂවල ක්‍රියාමාර්ග සහ අපේක්ෂකයන් තුලින්, සිය සමාජ අවශ්‍යතා ද, ආර්ථික අවශ්‍යතා ද, දේශපාලන විශ්වාස ද, ප්‍රකාශනයක් අත් කර නො ගන්නා බව දස ලක්ෂ ගනන් වැඩ කරන ජනතාව විසින් වටහා ගනු ලැබීම ඇරඹෙමින් පවතී. මහ සංගත-පාලිත ප්‍රතිගාමී

දේශපාලන ඒකාධිපතිත්වයට එරෙහිව සැබෑ විකල්පයක් ගොඩනැගිය යුතුව තිබේ. සමාජවාදී සමානතා පක්ෂයේ ව්‍යායාමය පදනම් වී ඇත්තේ ඩිමොක්‍රැටික් වේවා, රිපබ්ලිකන් වේවා ඉදිරියේ එන පාලනාධිකාරයට, එරෙහි අරගලය සහ සමස්තයක් වසයෙන් ඇමරිකානු අධිරාජ්‍යවාදයට එරෙහි අරගලය ඇරඹීම දැන් කලයුතු බව ය. කම්කරු පන්තිය නිල ද්විපක්ෂ පද්ධතියෙන් බිඳී වෙන් වී, අර්බුදයට හේතුව වන ලාභ ගරන පද්ධතියට එරෙහි වැඩ කරන ජනතාවගේ, ස්වාධීන දේශපාලන ව්‍යාපාරයක් ගොඩනැගිය යුතු ය.

## සැබෑ යුද විරෝධී ව්‍යාපාරයක්

සමාජවාදී සමානතා පක්ෂයේ ව්‍යායාමය එක්සත් ජනපදයේ පමනක් නො ව ජාත්‍යන්තරවම වැඩ කරන ජනතාව පිලිබඳව ඉමහත් වැදගත්කමක් දරා සිටී. එය මැද පෙරදිග එක්සත් ජනපදය යුදවාදය පුපුරා යාමට එරෙහිව ඇමරිකානු කම්කරු පන්තිය බලමුලුගැන්වීම ඉල්ලා සිටී. බුෂ් සහ කෙරී යන දෙදෙනාම ඉරාකය තුල යුද්ධය කර ගෙන යාමට අනිවාරනීයව කැප වී සිටිනා තතු තුල මෙම යුද්ධයට, මෙම ආක්‍රමනයට විරුද්ධ ව නැගී සිටීම එක්සත් ජනපදයේ ද ජාත්‍යන්තරව ම ද කම්කරු පන්තියේ වගකීම වන්නේ ය. ඉරාකයේ ද ඇෆ්ගනිස්ථානයේ ද අනෙකුත් සියලුම රටවල ද වැඩ කරන ජනතාව ආරක්ෂා කිරීමේ සප්‍රතිපත්තික ආස්ථානයකින් තොරව, ඇමරිකානු කම්කරුවන්ට තමන්ගේ ජීවන තත්වයන්ට ද, ප්‍රජාතන්ත්‍ර අයිතීන්ට ද එරෙහි ප්‍රහාරයට විරුද්ධව සටන් වැදිය නො හැකි ය. බුෂ් හෝ කෙරී යන මේ දෙදෙනාගෙන් කවුරු නායකත්වයේ සිටියත් ආන්ඩුව නියෝජනය කරන්නේ එක්සත් ජනපද මූල්‍ය කතිපයාධිකාරය ය; එරට කෝටි සංඛ්‍යාත වැඩ කරන ජනතාව නො වේ.

වියට්නාම් යුද සමයේ දී මෙන් දැනුදු ලොව පුරාම එක්සත් ජනපදය දකිනු ලබන්නේ, නව වර්ගයේ යටත් විජිතවාදයකට එරෙහිව යුක්තිසහගතව නැගී සිටින්නා වූ කුඩා සහ පීඩිත රටක ජනතාව යටත් කර ගැනීමට මාන බලමින් යුද්ධයක නිමග්නව සිටින්නා වූ ආක්‍රමනකාරී ජාතියක් ලෙස ය. ඉරාකය සහ වියට්නාමය අතර සාම්‍යය දැකගත හැකි වන්නේ භූමියේ හෝ එක්සත් ජනපද ප්‍රහාරයට එරෙහිව නැගී සිටින්නන්ගේ දෘෂ්ටිවාදයේ හෝ නො ව ආක්‍රමනිකයා විසින් යොදා ගනු ලබන විධික්‍රම තුල ය. යලිත් වරක් එක්සත් ජනපදය යෙදීගෙන සිටින්නේ කාර්මිකකරනය වූ රටක් විසින් පීඩිත පැරනි යටත් විජිත රටක විපක්ෂය සමූලඝාතනය කිරීම සඳහා වැඩි දියුනු අවි ආයුධ යොදාගනිමින් කරන සංහාරක යුද්ධයක ය. ධවල මන්දිරයේ සිට පහත මට්ටම දක්වා වූ එක්සත් ජනපද අනදෙන නිලධාරීහු 'නිදහසේ' හා 'ප්‍රජාතන්ත්‍රවාදයේ' නාමයෙන් කෙරෙන්නා වූ මුර්ගකම්වලට වගකිව යුතුව සිටිති. අබු ග්‍රයිබ්, ෆලූජා, සහ නජාෆ්, අධිරාජ්‍යවාදී ප්‍රචන්ඩත්වයේ සහ වර්ගවාදයේ සංකේතයක් ලෙස මයි ලායි පිටුපසින් ඉතිහාස පොත්වල පෙලගැසී ගනු ඇත.

එහෙත් වියට්නාම් යුගයේ දී කලාක් මෙන් නො ව අද දින දී යුද විරෝධී හැඟීම් ආමන්ත්‍රනය කිරීමට හෝ එය තමන්ට බඳවා ගැනීමට බරපතල ප්‍රයත්නයක් දැරීම ඩිමොක්‍රැටික් පක්ෂයට කල නො හැක්කක් බවට පත්ව තිබේ. කෙරී ද ඩිමොක්‍රැටික් පාක්ෂිකයෝ ද යුදවාදයේ පිලිවෙත සමග මුලුමනින් ම අනන්‍ය ව සිටිති; ඇමරිකාව විසින් ඉරාකය සහ ඇෆ්ගනිස්ථානය අල්ලා ගැනීමේ ප්‍රයත්නය අසාර්ථකවීමට ඉඩ හල නො හැකි යයි බුෂ් පරිද්දෙන් ම කියා සිටින ඔව්හු "ත්‍රස්තයට එරෙහි යුද්ධයට" බුෂ්ටත් වැඩි සම්පත් වැය කිරීමට සපථ කර සිටිති. මහ ජාවාරම්කරුවන්ගේ අත්දැකීම් සහිත විශ්වාසිත නියෝජිතයෙකු වූ මැසචුසෙට්ස් සෙනේට් මන්ත්‍රී තෙමේ, (කෙරී), හොඳටම වැඩි වුවොත් ඉදිරිපත් කර සිටින්නේ බුෂ් පාලනාධිකාරයට වඩා ශෛලියේ වෙනසකි, හරයේ වෙනසක් නො වේ.

2004 මැතිවරන ව්‍යායාමය වෙනම තල දෙකක දිගහැරෙමින් පවතී. ඇමරිකානු පාලක ප්‍රභූව ඇතුලත භයංකර අරගලයක් දරන හරිමින් පවතී. ලාභ ගරන පද්ධතියේ පරස්පර විරෝධයන් නො විසඳිය හැකි වත් වත් මෙහි කටුකත්වය ද උග්‍ර වේ. එහෙත් එය වනාහි එකඟ වූ අරමුනු සඳහා යොදාගත යුත්තේ කුමන විධික්‍රම ද කුමන පුද්ගලයන් ද යන්න තීන්දු කිරීම ද සඳහා ඩොලර් බිලියන ගනන් වියදම් කරනු ලබන පාලක ප්‍රභූව තුල ම සිද්ධවන්නා වූ අරගලයකි.

බුෂ් පිලිබඳව කෙරී දක්වන්නේ කුමන වර්ගයේ විවේචනයන් වුව ද, කෙරී හා බුෂ් අතර පවත්නේ සාර වසයෙන් ම උපායාත්මක මතභේදයන් ය. බුෂ් ඉවබව නැතිව දියත් කල මැද පෙරදිග සහ මධ්‍යම ආසියා ආක්‍රමනයන් සාර්ථකව සමාප්ත කිරීම සඳහා, ජාත්‍යන්තර සහය වඩාත් සාර්ථකව ගොනු කර ගත හැකි වූ ද, එවන් යුද්ධයක් උදෙසා අවශ්‍ය කෙරෙන ජීවන තත්වයන් කැප කිරීම් ද, ලේ හැලීම් ද "සාධාරනය" යන මිථ්‍යා විශ්වාසය ඇමරිකානු ජනයා තුල තහවුරු කල හැකි වූ ද නව පාලනාධිකාරයක් අවශ්‍ය ව පවතී යයි කෙරී කියා සිටී. මෙම ඡන්ද විමසීම බුෂ් පාලනාධිකාරයේ වඩාත් ම වෛරපාත්‍ර ගතිලක්ෂනයන්ට ප්‍රතිරෝධය දැක්වීම් වස් යොදා ගැනීමට වැඩ කරන මහාජනයා යත්න දරන තතු තුල ඩිමොක්‍රැටික් පක්ෂයේ ව්‍යායාමය පාලක ප්‍රභූවට ප්‍රානසම භූමිකාවක් ඉටු කර දෙයි - එම භූමිකාව නම් "බුෂ් හැර වෙන ඕනෑම කෙනෙක්" (යන සටන් පාඨයට උචිත) අපේක්ෂකයා සැබැවින් ම වඩා හොඳ තත්වයක් ඇති කරන වෙනසක් ලබාදෙනු ඇතැයි යන මිත්‍යාව පතුරුවාලීම ය. එහෙත් කෙරීගේ ජයග්‍රහනය මහා ජනයා උදෙසා ජයග්‍රහනයක් නො වනු ඇත; එය ද්විපක්ෂ ක්‍රමය ලබන ජයග්‍රහනයක් වනු ඇති අතර එහි භූමිකාව වනු ඇත්තේ මහාජන අතෘප්තිය සුරක්ෂිත දේශපාලන ඇලමංවලට හරවා යැවීම ය.

ඩිමොක්‍රැටික් පක්ෂය එන්න එන්නම පුහු ජනතාවාදී

සෝෂා මගින් මිථ්‍යාවන් තොරම්බල් කරනවා පමනක් නො වේ. එය වැඩ කරන ජනතාව උදෙසා කුමන හෝ දේශපාලන විකල්පයක් වුව ලොප් කර දැමීමට ක්‍රියා කරයි; ඒ සඳහා තුන්වන - පක්ෂ අපේක්ෂකයන් ඡන්ද විමසීමෙන් ඉවත් කර දැමීමට ද ඔවුන්ගේ ව්‍යායාමයන් කඩාකප්පල් කරලීම සඳහා ද හිතුවක්කාර, අගතිගාමී ඡන්ද පත්‍රිකා-ප්‍රවිෂ්ට පටිපාටීන් (එක් එක් ප්‍රාන්ත රාජ්‍යයක ජනාධිපතිවරන හෝ වෙනත් නිලවරන ඡන්ද පත්‍රිකාවක අපේක්ෂකයකු වසයෙන් නම ඇතුලත් කර ගැනීමට තුන්වන පක්ෂයට පැන වී ඇති පටිපාටීන්) යොදා ගනී. තමන්ගේ දේශපාලන විරුද්ධවාදීන්ගේ සම්පත් වැය කර, ඡන්දදායක මහජනතාවට ආමන්ත්‍රනය කිරීමට ඇති ප්‍රජාතන්ත්‍ර අයිතිය ක්‍රියාත්මක කිරීමෙන් ඔවුන් වලක්වා ලීම සඳහා, ඩිමොක්‍රැටික් පක්ෂය, ස්වාධීන ජනාධිපති ධුරාපෙක්ෂක රැල්ප් නාඩර්ගේ ද, සමාජවාදී සමානතා පක්ෂ ජනාධිපති ධුරාපෙක්ෂක බිල් වෑන් හා උපජනාධිපති අපේක්ෂක ජිම් ලෝරන්ස්ගේ ද සමාජවාදී සමානතා පක්ෂයේ ප්‍රාන්ත මන්ත්‍රී මන්ඩල ධුරාපෙක්ෂක ටොම් මැකමන්ගේ ද ඡන්ද පත්‍රිකා-ප්‍රවිෂ්ට පෙත්සම්වලට එරෙහි පදනම් විරහිත අභියෝග ගොනු කර තිබේ.

එක්සත් ජනපදයෙහි පමනක් නො ව, ජාත්‍යන්තරව ද කම්කරු ජනයා අරබයා සසප ව්‍යායාමය ඉමහත් වැදගත්කමක් උසුලයි. ඇමරිකානු යුදවාදයෙහි පෙර නො වූ විරු පිපිරීමක හා ලොව අනිකුත් සෑම කොටසක ම ආන්ඩුවලට ආදර්ශයක් සපයන්නා වූ එක්සත් ජනපද කම්කරුවන්ගේ අයිතීන්ට හා ජීවන තත්වයන්ට එරෙහි ප්‍රහාරයක සන්දර්භයක් තුල ය සසප මැතිවරන ව්‍යායාමය දියත් වන්නේ.

මෙම ව්‍යායාමය දියත් කිරීමේ දී, සමාජවාදී සමානතා පක්ෂය මුලුමනින් ම යථාර්ථවාදී ය. වත්මන් තත්වය තුල දී අපගේ අපේක්ෂකයන්ට ලැබෙනු ඇත්තේ සීමිත ඡන්ද සංඛ්‍යාවක් පමනක් බව අපි මැනවින් වටහා ගෙන ඇත්තෙමු. එහෙත් අපගේ ව්‍යායාමයේ අරමුන නම් ඇමරිකා එක්සත් ජනපදය තුල ද ජාත්‍යන්තරව ම ද දේශපාලන විවාදයේ මට්ටම ඉහල නැංවීම ය; දක්ෂිනාංශික ධනේශ්වර දේශපාලනයේ දඬු කඳින් ගැලවී, ස්ථාපිත පක්ෂවල හා ජන මාධ්‍යවල ජනසෝෂකකම්වලට විරුද්ධ සමාජවාදී විකල්පයක් ඉදිරිපත් කිරීම ය. අපගේ ව්‍යායාමය ඡන්ද පිලිබඳව නො වේ: අදහස් හා පිලිවෙත් පිලිබඳව ය.

සමාජවාදී සමානතා පක්ෂය මෙම මැතිවරනය සමාජ හා දේශපාලන අර්බුදය පිලිබඳ බරපතල සාකච්ඡාවක් වර්ධනය කිරීමේ අවස්ථාවක් ලෙස යොදා ගනු ඇත: එමගින් ඇමරිකානු සමාජයේ විප්ලවවාදී පරිවර්තනයක් සඳහා මහා ජන පදනමක් තහවුරු කිරීමට අවශ්‍ය ක්‍රියා මාර්ගික අත්තිවාරම් දැමීම පිනිස මේ අවස්ථාව යොදා ගනු ඇත.

සසපය මෙම ව්‍යායාමය හුදෙක් ජාතිකව නො ව ජාත්‍යන්තර මට්ටමක ඉදිරියට ගෙන යාමට අපේක්ෂා කරයි. ඇමරිකානු අධිරාජ්‍යවාදය විසින් පවත්වා ගෙන යනු ලැබෙන පිලිවෙත්වල විනාශකාරී බලපෑමට ගැඹුරෙන් ම සිය ජීවිත හසුව ඇත්තා වූ ලෝකය පුරා වැඩ කරන හා පීඩිත ජනතාවගේ අවශ්‍යතාවන් මෙම ව්‍යායාමය මගින් නියෝජනය කිරීමට අපට උවමනා ය. එක්සත් ජනපදයේ භූගෝල පරිමාන බලපෑම පවත්නා තතු තුල ඇමරිකානු ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීමේ ක්‍රියා දාමයට සෑම රටක ම පුරවැසියන්ට සහභාගි වීමට ඉඩ දීම මුලුමනින් ම උචිත වනු ඇත. තව මත් මෙය ඉටු කර ගත නො හැකිව පවතින හෙයින් ඇමරිකානු කම්කරුවන් ද ලෝකය පුරා ඔවුන්ගේ පන්ති සහෝදරයන් හා සහෝදරියන් ද අතර ජාත්‍යන්තර සමගිය පිලිබඳ දැනුවත් හැඟීමක් වර්ධනය කිරීමට සසප අපේක්ෂකයන් මෙම මැතිවරනය යොදා ගනු ඇත.

අපගේ ව්‍යායාමයේ ඉතා ම වැදගත් කර්තව්‍යය ලෙස අප දකින්නේ මෙම ජාත්‍යන්තර සමගිය සඳහා අරගලය යි. අධිරාජ්‍යවාදයට එරෙහිව සැබවින් ම ලෝක පරිමාන ව්‍යාපාරයකට ආහාසය සැපයීම අත්‍යවශ්‍ය ය. එවන් ව්‍යාපාරයක් ආගමික, ජන වාර්ගික හෝ ජාතික අඩයාලම් මත පදනම් වූ සියලු වර්ගවල ජාත්‍යෝත්තමවාදයන්ට හා ස්වෝත්තමවාදයන්ට එරෙහි වනු ඇත.

එවන් විකල්පයක අවශ්‍යතාව දකින්නා වූ සියලු දෙනාට අපි මෙසේ කියමු: අද දින ම සමාජවාදී සමානතා පක්ෂය අමතන්න, අපගේ අපේක්ෂකයන් ඔබගේ ප්‍රාන්තය තුල අපේක්ෂක ලැයිස්තුවට ඇතුලත් කිරීමට උත්සාහ කර උදව් වන්න. ඔබගේ මන්ත්‍රී මන්ඩල කොට්ඨාසය තුල සසප අපේක්ෂකයා ලෙස ඉදිරිපත් වීමට එකඟ වෙමින් සසප ව්‍යායාමයේ පිලිවෙත්වලට සටන් වදින්න.

## අර්බුදයේ මූලයෝ

වැඩ කරන ජනතාව මුහුන දී සිටින ප්‍රශ්නයන් හුදෙක් බුෂ් ජනාධිපතිකමෙන් පහ කර දැමීම මගින් විසඳා ලිය හැකි ය යි විශ්වාස කිරීම මිථ්‍යාවකි. බුෂ් පාලනය වනාහි අවසාන විග්‍රහයේ දී තමන්ට කිසිදු — ප්‍රගතිශීලී බව පසෙක තිබියේවා — තර්කානුකූල වූ විසඳුමක් පවා නොමැති පද්ධතිමය අර්බුදයකට මුහුන දී සිටින ඇමරිකානු පාලක ප්‍රභූවේ මංමුලාව ද ඉවබව නැතිකම ද නියෝජනය කරන්නකි. බුෂ්ගෙන් ද ඔහුගේ සහකරුවන්ගෙන් ද නියෝජනය වන්නේ සාරභූත වශයෙන් ම ජරා, ප්‍රතිගාමී, පමනක් නො ව අපරාධකාරී ද වූ අංශයක් බවට කිසිදු සැකයක් නොමැත. එහෙත් නොවැම්බරයේ දී ඔවුන් බලයෙන් ඉවත් කර දැමුවත්, ඩිමොක්‍රැටික් පක්ෂයේ අපේක්ෂකයන් විසින් ඔවුන් ඉවත් කර දමනු ලැබීම, ඇමරිකානු අධිරාජ්‍යවාදය එක්සත් ජනපදය තුල ම ද ජාත්‍යන්තරව ම ද දරන්නා වූ ප්‍රචන්ඩ, විනාශකාරී ගමන් මග වැදගත් අන්දමකින් වෙනස් කරනු නැත.

ඩිමොක්‍රැටික් පක්ෂය ජයග්‍රහනය කල හොත්, මැතිවරන ව්‍යායාමයේ දී ඔවුන් දෙන පොරොන්දු

මැතිවරන සෝෂාවේ දී යෙදෙන නරුම අභ්‍යාසයක් බව ඉක්මනින් ම එලිදරව් වනු ඇත. අලුත් ඩිමොක්‍රැටික් පාක්ෂික ජනාධිපතිවරයෙකු ඉහත කී මහ කොම්පැනිවල අවශ්‍යතාවලට ද යටත් වනු ඇත: ලෝක ආධිපත්‍යය උදෙසා පවත්වා ගෙන යනු ලබන එම මූලෝපාය ම අනුගමනය කරනු ඇත.

ඇමරිකානු පිලිවෙතේ අතිමූලික හා ප්‍රගතිශීලී වෙනසක් ඇති කිරීම සඳහා හුදෙක් පාලක පුද්ගලයන් මාරු කිරීම නො සෑහේ. ඒ සඳහා මහ කොම්පැනි ද දැවැන්ත පුද්ගලික ධනය ද ලාභ ගරන පද්ධතිය ම ද අවසන් කරනු ඇත්තා වූ සමාජ විප්ලවයක් කල යුතුව ඇත. එවන් සමූල වෙනසක අවශ්‍යතාව පැන නගින්නේ ඇමරිකානු ධනවාදයේ අර්බුදයෙහි ස්වභාවයත් ගැඹුරත් විසිනි.

**එම අර්බුදයේ හේතු නම්:**

1. **ජාතික රාජ්‍ය පද්ධතියේ බිඳ වැටීම:** භූගෝලීයකරනය නමින් හැඳින්වෙන -- ලෝක ආර්ථිකයේ පෙර නො වූ විරූ ඒකාග්‍රකරනය හා අන්‍යෝන්‍ය ආයත්තතාව (එකක් අනෙක මත රඳා පැවැත්ම) නම් වන -- ප්‍රපංචය ධනවාදය පදනම් වන ජාතික රාජ්‍ය පද්ධතිය සමග ගැලතිය නො හැකි ය. ඇමරිකානු අධිරාජ්‍යවාදයේ ප්‍රචන්ඩ පුපුරා හැලීමේ සාරභූත ප්‍රකාශනය වන්නේ පූර්ව-භංග යුද්ධය පිලිබඳ බුෂ් පාලන තන්ත්‍රයේ න්‍යාය යි. මෙය නිරූපනය කරන්නේ, තනි රටක ආධිපත්‍යය ස්ථාපනය කිරීම තුලින්, එනම් අන් සියලු රටවලට එරෙහිව ඇමරිකා එක්සත් ජනපදයේ ආධිපත්‍යය ස්ථාපිත කිරීම තුලින් ලෝක ආර්ථිකය හා ජාතික රාජ්‍ය අතර විසංවාදය විසඳීමේ සාහසික වෑයමකි.

2. **ලාභ ගැරීමේ ආයාසය සහ ඇමරිකානු හා ජාත්‍යන්තර කම්කරු පන්තිය සූරා කෑම සඳහා ධාවනය:** කම්කරු පන්තියේ සමාජ තත්වයෙහි ලෝක පරිමාන පිරිහීම පාරජාතික සංගත බිහි වීම සමග එකට වෙලී ඇත. මෙම සංගතයෝ ලාභ අමුද්‍රව්‍ය හා අඩු වැටුප් සොයමින් ලෝක ගෝලය වටා යති. වඩවඩාත් ලාභ අනුපාතික ගෙන දිය හැකි පරිදි අඩු වැටුප් හා සූරා කෑම වඩාත් කුරිරුව පවතින රටවලට රැකියා මාරු කිරීම පහසු කිරීම සඳහා තාක්ෂනයෙහි දියුනුව උපයෝගි කර ගැනේ. මේ අනිවාරනීය වූ භූගෝලීය ධනේශ්වර වර්ධනයේ ක්‍රියාවලියෙහි දී ඇමරිකානු කම්කරුවන් වෙත ඇති කෙරෙන ඍජු බලපෑම වී ඇත්තේ රැකියා නැතිව යාමත් වැටුප් වැටීමත් ය.

නිෂ්පාදනයෙහි වර්ධනය වන භූගෝලීය ස්වභාවය, එලෙස ම ගත් කල, විභව වශයෙන් ප්‍රගතිශීලී වර්ධනයක් වේ. එය ලොව වටා දුප්පත්කම නැති කිරීම හා ජීවන තත්වය නැංවීම සඳහා මිනිසාගේ නිෂ්පාදන බලවේග තාර්කිකව ඒකාග්‍රකරනය කිරීමේ හා ව්‍යාප්ත කිරීමේ හැකියාව විවෘත කරයි. එනමුදු, පුද්ගලික ධන රැස් කිරීමට මානව අවශ්‍යතා යටත් කරන කර්මාන්ත හා මූල්‍යකරනය පිලිබඳ ධනේශ්වර පුද්ගලික අයිතියේ රාමුව තුල භූගෝලීයකරනය ක්‍රියාත්මක වන්නේ කම්කරු පන්තියට එරෙහිව ය.

භූගෝලීය වශයෙන් ඒකාග්‍රකරනය වූ නිෂ්පාදනය හා ප්‍රාග්ධනයෙහි පෙර නො වූ විරූ අන්දමේ සංකේන්ද්‍රනය පැරනි කම්කරු සංවිධානවල දිශාවනතියට — ජාතික කර්මාන්ත හා ජාතික ශ්‍රම වෙලඳපොල ආරක්ෂා කර ගැනීමට — වල කපයි. එක්සත් ජනපදයෙහි ඒඑෆ්එල්-සීඅයිඕ සංවිධානය ඇතුලුව සෑම රටක ම මෙම නිලධාරිවාදී සංවිධානවල භූමිකාව කම්කරුවන්ට වාසි ලබා ගැනීම සඳහා හාම්පුතුන්ට බලපෑම් කිරීම පවා අත හැර දැමී ඇත: දැන් ඔවුන් යෙදී සිටින්නේ ප්‍රාග්ධනය ආකර්ෂනය කර ගැනීම සඳහා හාම්පුතුන්ට වාසි සලසා දෙන ලෙස කම්කරුවන්ට බලපෑම් කිරීමේ ය. ජාතික වැඩ පිලිවෙලකට ඇලීගැලී සිටින මෙම සංවිධානවලට ඉටු කල හැක්කේ අතිමූලික වශයෙන් ප්‍රතිගාමී භූමිකාවක් ම පමනි.

තම රැකියා වැටුප් හා සේවා තත්වයන් ආරක්ෂා කර ගැනීම සඳහා, ඇමරිකානු කම්කරුවෝ, තමන් ව්‍යාපාරික හාම්පුතුන්ට යටත් කර දමන්නා වූ ද වෙනත් රටවල තම පන්ති සොහොයුරන්ගෙන් බෙදා වෙන් කරන්නා වූ ද සකල ආකාර ආර්ථික ජාතිකවාදයන් හා ආරක්ෂන ප්‍රතිපත්ති ප්‍රතික්ෂේප කල යුත්තාහ: පාරජාතික සංගතවල භූගෝලීය මූලෝපායන්ට එරෙහිව තමන්ගේ ම මූලෝපායන් පිහිටුවා ගත යුත්තා හ. ඔවුන් රැකියා හා ජීවන තත්වයන් ආරක්ෂා කර ගැනීම සඳහා තම අරගල ජාත්‍යන්තර වශයෙන් කම්කරුවන්ගේ අරගල සමග සම්බන්ධීකරනය කිරීමට දැනුවත්ව යොමු විය යුතුව ඇත: ධනේශ්වර විරෝධී හා සමාජවාදී පොදු වැඩ පිලිවෙලක් මත සියලු රටවල කම්කරුවන්ගේ අවශ්‍යතාවන් ආරක්ෂා කර ගැනීම සඳහා සටන් වැදිය යුතුව ඇත.

3. **සමාජ අසමානතාව වර්ධනය වීම:** ලොව වෙසෙන බිලියන 6.3ක ජනතාවගෙන් අතිමහත් බහුතරයේ අවශ්‍යතාවන් සමාජයෙහි ඉතා ම සුලු කොටසකගේ පුද්ගලික අවශ්‍යතාවන්ට යටත් කරනු ලැබ ඇත. පසු ගිය දශක දෙක තුල සමාජ අසමානතාවේ පරිමානයෙහි දැවැන්ත වර්ධනය හුදෙක් ම ධනවාදයේ අප්‍රසන්න ලක්ෂනයක් ම නො වේ: ඊට වඩා එක්සත් ජනපදය හා අනෙකුත් දියුනු ධනේශ්වර රටවල ජනයාගෙන් පොහොසත් ම සියයට එක තුල ධනය අතිමහත් ලෙස සංකේන්ද්‍රනය වීම ම මුලු සමාජ-ආර්ථික පද්ධතිය දුෂ්කෘත කර දැමීමේ (මානව අවශ්‍යතා සම්පාදනයට එරෙහිව පිහිටුවා ලීමේ) ප්‍රධාන සාධකයක් බවට පත්ව ඇත. රැකියා, සෞඛ්‍ය උපස්ථායක සේවා, අධ්‍යාපනය, නිවාස ආදි, මොන ම ප්‍රශ්නයක් හෝ කොතරම් බරපතල වුව ද සමාජ අර්බුදයේ කිනම් අංශයකට හෝ යෝජිත ප්‍රතිකර්ම, ඒවා පිලිගැනීම හෝ නො පිලිගැනීම තීන්දු කරන මිනුම්දන්ඩ බවට පත්ව ඇත්තේ පොහොසතුන්ගේ පුද්ගලික ධනය කෙරේ එය විසින් ඇති කරනු ලබන බලපෑම යි. සියලු ම දේශපාලන, සමාජ හා ආර්ථික ප්‍රශ්නවලට විසඳුම්

තීරනය කරනු ලැබෙන්නේ පහත සඳහන් සූත්‍රය විසිනි: පොහොසතුන්ගේ ධනය වර්ධනය කෙරෙන සියල්ල ම හොඳ ය. පුද්ගලික ධනය ගොඩ ගසා ගැනීමට බාධා පමුනුවන සියල්ල නරක ය: පුලුවන් නම් එවැනි දේ නීති විරෝධී කල යුතු ය.

4. **ධනවාදයෙහි අරාජිකත්වය:** සංකීර්න මහා ජන සමාජයක් මගින් වඩවඩාත් පුලුල් කෙරෙන සමාජ අවශ්‍යතාවන්, නිෂ්පාදන ක්‍රමයෙහි පුද්ගලික අයිතියේ හා පුද්ගලික ධනය අසීමිත ලෙස එක්රැස් කිරීමේ රාමුව තුල සැපයිය නොහැකිම ය. මානව වර්ගයාගේ නිෂ්පාදන බලවේග හා තාක්ෂනය විද්‍යාත්මක වූ ද හා සාමාජීය උවමනා මත උපයෝගි කර ගැනීමේ අවශ්‍යතාව — මෙය ඉටු නො කිරීම මානව ශිෂ්ටාචාරයේ භෞතික පැවැත්මට ම තර්ජනයක් එල්ල කරයි — විසින් ලාභ ලැබීමේ අභිප්‍රාය මානව හිතවාදී, ප්‍රජාතාන්ත්‍රිය හා බුද්ධිමත් සමාජ සැලසුම්කරනයට සවිඥානකව යටත් කිරීමේ ඓතිහාසික කර්තව්‍යය ඉස්මතු කරනු ලබයි. එය වනාහි සමාජවාදය විසින් ධනවාදය විස්ථාපනය කර දමනු ලැබීමේ කර්තව්‍යය යි. මේ අන් කිසිවක් නො ව ධනවාදය පෙරලා දමා සමාජවාදය ස්ථාපනය කිරීම ය.

මෙම අරගලයට නායකත්වය සපයා සමාජවාදයේ අත්තිවාරම පිහිටුවා ලීමට සමත් එක ම පන්තිය නම් කම්කරු පන්තිය යි. අද දින මහා, භූගෝලීය කෘත සමාජය තුල, ඉතා ම දුප්පත් වූ කම්කරුවන් ද හුදෙක් කර්මාන්තවල යෙදුනා වූ කම්කරුවන් ද යන මේ සියල්ලට අමතරව ඉතා පෘථුල ස්තරයක් කම්කරු පන්තියට ඇතුලත් වෙති. බර වැඩ නො කරන සේවකයන් — සරසවි අධ්‍යාපනය ලත් සවෘත්තිකයන්, කලාව හා සංස්කෘතියේ ක්ෂේත්‍රවල යෙදී ගත් උදවිය — යන මේ සියල්ලෝ ම තම දිවිපෙවෙත වැටුප් මත රඳා පවත්වා ගන්නෝ ය. ආසියාව, ලතින් ඇමරිකාව සහ අප්‍රිකාව වැනි පැරනි විජිත රටවල, කලින් ගොවීන්ව සිටියා වූ කෝටි සංඛ්‍යාත ජනයා කම්හල්වල ද දාඩිය මඩුවල ද දැවැන්ත මහා සංගතයන්හි අවශ්‍යතා සම්පාදනය කිරීම සඳහා යෙදීමට නගරවලට ගෙන එනු ලැබේ. එමගින් කම්කරු පන්තියේ සංඛ්‍යාව ඉමහත් ලෙස වැඩි කරනු ලැබෙයි: ලෝක ආර්ථිකය තුල එහි සමාජමය බර (විශිෂ්ට ගුරුත්වය) වර්ධනය කෙරෙයි.

බිලියන සංඛ්‍යාත වැටුප් උපයන්නෝ ද කුඩා හා මධ්‍ය පරිමාන ව්‍යවසායන්හි හිමිකරුවෝ ද එන්නඑන්න ම වැඩි වන්නා වූ යෝධ කාර්මික හා මූල්‍ය ප්‍රාග්ධන රාශීන් පාලනය කරන කුඩා ප්‍රභූවක සිතුමතයේ ගොදුරු බවට පත්ව සිටිති. අප දැන් ජීවත් වන්නේ ''කොටස් අයිතිකාර ප්‍රජාතන්ත්‍රයක් තුල ය'' යන කියා පෑම වංචාවකි. ප්‍රතිසංස්කරනයන් නිල දේශපාලනයේ නීති යුක්ත කොටසක් ය යි සලකනු ලැබූ පෙර සමයක දී නම් නිෂ්පාදන බලවේග ඒකාධිකාරයකට යටත් කිරීම ප්‍රජාතන්ත්‍රයට සතුරු යැයි සලකනු ලැබිනි, මහා සංගත හා කතිපයාධිකාරයන් බිඳ හෙලීමට පියවර ගනු ලැබිනි. නිල ධනේශ්වර දේශපාලනයේ සියලු අංශ විසින් මෙවන් පිලිවෙත් අත හැර දමනු ලැබ බොහෝ කලක් ගත වී හමාර ය.

සමාජවාදී වැඩ පිලිවෙලක් මත, අතිමහත් බහුතරයක ජනතාවගේ ආර්ථික ජීවිතය ප්‍රතිසංවිධාන කිරීම කම්කරු පන්තියට භාර වේ. මේ සඳහා මූලික පූර්ව කොන්දේසිය වන්නේ මූල්‍ය ක්ෂේත්‍රයේ වේවා, විද්‍යුත් සන්නිවේදනයේ වේවා, සන්නිවේදන තාක්ෂනයේ වේවා, ඖෂධ ක්ෂේත්‍රයේ වේවා, බලශක්තියේ, ප්‍රවාහනයේ, හෝ ආර්ථික ජීවිතයේ වේවා මහජනතාවගේ ජීවිතවලට සෘජුව බලපාන්නා වූ ආර්ථිකයේ වෙනත් කිසි යම් අංශ හෝ වේවා ප්‍රජාතන්ත්‍රවාදී හා පලල් මහජන පාලනයක් තහවුරු කිරීම යි.

2004 ඡන්ද විමසීමට සමාජවාදී සමානතා පක්ෂය මැදිහත් වන්නේ දේශපාලන වශයෙන් ප්‍රතිගාමී හා සමාජමය වශයෙන් බංකොලොත් වූ ජාවාරම්කාර ඇමරිකානු දේශපාලන පක්ෂවලට එරෙහිව සමාජවාදී විකල්පයක් සපයන්නට පොදුජන දේශපාලන ව්‍යාපාරයකට මුල පිරීමේ අටියෙනි. මෙම ව්‍යාපාරයේ අරමුන වන්නේ ධනේශ්වර පන්තියේ දේශපාලන ආධිපත්‍යය අවසන් කර කම්කරු ආන්ඩුවක් පිහිටුවීම යි. එවන් ආන්ඩුවක් වැඩ කරන ජනතාවගේ සමාජ හා ආර්ථික අවශ්‍යතාවන් නියෝජනය කරන අතර තම ජීවිත කෙරේ බලපාන්නා වූ තීන්දු මත ඔවුන්ට ඇති ප්‍රජාතන්ත්‍ර පාලනය ද දැවැන්ත ලෙස වර්ධනය කරනු ඇත. ඇමරිකානු කම්කරු පන්තිය සංවිධානය කර, දැනුවත් කර, එය පන්ති විඥානයෙන් යුතු හා දේශපාලන වශයෙන් ස්වාධීන බලවේගයක් බවට පරිවර්තනය කිරීම ඒ සඳහා අත්‍යවශ්‍ය වේ. ඒ සඳහා කම්කරු පන්තිය තුල ඩිමොක්‍රැටික් හා රිපබ්ලිකන් පක්ෂවල අනුහස බිඳ දැමීමට සසපය උත්සුක වේ. අපගේ ව්‍යායාමයේ අරමුන වන්නේ ඇමරිකානු කම්කරු පන්තිය සංවිධානය කොට, අධ්‍යාපනගත කොට පන්ති විඥානයෙන් යුතු ස්වාධීන දේශපාලන බලවේගයක් බවට පරිවර්තනය කිරීම යි.

## එක්සත් ජනපද අධිරාජ්‍යවාදය සහ යුද්ධය

2004 ඡන්ද ව්‍යාපාරය ඇමරිකානු යුදවාදයේ පුපුරා යාම විසින් විලක්ෂනය කෙරේ. බුෂ් ධවල මන්දිරය අල්ලා ගත් තැන් පටන් එක්සත් ජනපදය ඇෆ්ඝනිස්ථානයට සහ ඉරාකයට පහර දී අල්ලා ගෙන, සිරියාව, ඉරානය සහ උතුරු කොරියාව ඉදිරි ප්‍රහාර සඳහා ඉලක්ක කර ගෙන සිටී; පිලිපීනය, පකිස්ථානය, කසකස්ථානය, ජෝර්ජියාව, ලයිබීරියාව සහ කොලොම්බියාව තරම් එකිනෙකට ඈත් වූ රටවල්වල හමුදා බලකා, ගුවන් බලය සහ වෙනත් යුද්ධ බලයන් යොදවා ඇත.

ඇමරිකානු යුද ප්‍රහාරයේ ස්වභාවය අධිරාජ්‍යවාදී ය, නව විජිතවාදී ය. සෝවියට් සංගමය බිඳ වැටීමේ පටන් එක්සත් ජනපද පාලක ප්‍රභූව විශ්වාස කර ගෙන සිටින්නේ භූගෝලීය ආධිපත්‍යය සඳහා තමන්ගේ ධාවනයට කිසිදු සාර්ථක බාධාවක් නො පවතී ය යන්න

යි. පිලිමල් බලවතුන් තමන්ට අභියෝග කිරීමට ශක්තිමත් වී ගැනීමට පෙර ඇමරිකානු-පාලිත පාරජාතික සංගතයන්ගේ අවශ්‍යතා සපුරා ගැනීම එය තම එල්ලය කර ගෙන සිටී. යුදවාදයේ මෙම පුපුරා හැලීම 2001 සැප්තැම්බර් 11 දා ත්‍රස්ත ප්‍රහාරයන්ට දක්වන ලද ආරක්ෂාකාරී ප්‍රතිචාරයක් ය යි බුෂ් ද ඇමරිකානු මාධ්‍යයන් ද පෙන්නුම් කරන නමුත්, බුෂ් යටතේ බලය අල්ලා ගෙන සිටින අන්ත-දක්ෂිනාංශික කන්ඩායම 1990 ගනන් පුරා ම එවන් පිලිවෙතක් ක්‍රියාත්මක කල යුතු ය යි කියා සිටියෝ ය. සැප්තැම්බර් 11 දා ත්‍රස්ත ක්‍රියාවෙන් සිදු වූයේ කලින් ම සූදානම් කර ගනු ලැබූ මෙම න්‍යාය පත්‍රය ක්‍රියාවට දැමීමට ව්‍යාජයක් සම්පාදනය වීම ය.

එක්සත් ජනපදය විසින් ඉරාකය අල්ලා ගනු ලැබීමට සැබෑ අරමුනු තුනක් තිබේ: ලෝකයේ දෙවන තරමට විශාල තෙල් නිධි අල්ලා ගැනීම; ඇමරිකානු යුද හමුදා මැද පෙරදිග හරි මැද තබමින් තම විභව ප්‍රතිවාදීන්ට එරෙහි පෙර නුවූ විරූ භූ-මූලෝපායික වාසියක් දිනා ගැනීම; රට තුල සමාජ අතෘප්තිය වර්ධනය වලහා ලීම සඳහා බාහිර නොමග යැවීමක් සපයා ලීම.

ධනේශ්වර ආර්ථිකය සහ යුද්ධය අතර නො බිඳිය හැකි බැම්මක් තිබේ: ප්‍රධාන අධිරාජ්‍ය බලවත්තු වෙලඳ පොල, ලාභ, ලාභ ශ්‍රමය සහ අමුද්‍රව්‍ය අල්ලා ගැනීම සඳහා එන්නඑන්න ම උග්‍ර වන තරගයක යෙදී සිටිති. අවසාන විග්‍රහයේ දී, ජාත්‍යන්තර කම්කරු පන්තිය විප්ලවවාදී බලවේගයක් ලෙස ඉදිරිපත් වී සමස්තයක් වශයෙන් අධිරාජ්‍යවාදය හමාර කර දමන්නේ නැති නම් ප්‍රධාන ධනපති බලවතුන් අතර භූගෝල පරිමාන ඝට්ටනයක් වලක්වා ලිය නො හැකි ය.

''ත්‍රස්තවාදයට'' එරෙහි අරගලය පිලිබඳ කතාව ඉස්මත්තට ගෙන ඇත්තේ ඇෆ්ඝනිස්ථානයේ හා ඉරාකයේ තම යුද සැලසුම්වල සාපරාධී බව වසන් කර ලනු සඳහා ය. අද දින ''ත්‍රස්තවාදියා'' හා ''මූර්ග පාලකයා,'' ඊයේ මිත්‍රයා නො වූ අවස්ථාවලට වඩා එසේ වූ අවස්ථාවන් වැඩි ය. (ඇමරිකානු පාලනයේ පැරනි මිතුරන්ව සිට අද මෘගයන් ලෙස හඳුන්වනු ලබන අය) සදාම් හුසේන් පමනක් නො ව ඔසාමා බින් ලාඩන්, ස්ලොබොදාන් මිලොසෙවික්, මනුවෙල් නොරියේගා සහ පසු ගිය දශක දෙක තුල එක්සත් ජනපද යුද්ධමය ක්‍රියාවන්ට ඉලක්ක වූ තවත් බොහෝ දෙනා මීට ඇතුලත් ය.

ඉස්ලාමීය මූලධර්මවාදී ත්‍රස්තවාදය පරදවා ලීමේ එක ම මග එහි නිධානය ඉවත් කර දැමීම යි. එනම් එක්සත් ජනපදය විසින් මැද පෙරදිග යුද්ධමය, දේශපාලන සහ ආර්ථික වශයෙන් දරනු ලබන ආධිපත්‍යය අවසන් කොට සියලු ඇමරිකානු හමුදා මැද පෙරදිගින් ඉවත් කොට, එම ප්‍රදේශයේ ජනයාට තමන්ගේ ම දේශපාලන ගමන් මග නිර්නය කර ගැනීමට, තමන්ගේ ම සම්පත් පාලනය තීන්දු කර ගැනීමට නිදහස ලබා දීම යි. මැද පෙරදිග ගැටුමට ප්‍රජාතන්ත්‍රවාදී විසර්ජනයක් ලබා දීමට, යුදෙව්වන්ට, අරාබියට, කුර්ද් ජනයා හා වෙනත් ජනතාවන්ට සාමයෙන් එකට ජීවත් වීමට අත්‍යවශ්‍ය පූර්ව කොන්දේසිය නම් එය යි. එක්සත් ජනපදයේ හමුදා සියල්ල ම ඉරාකයෙන්, ඇෆ්ඝනිස්ථානයෙන් හා මුලු මහත් මැද පෙරදිගින් ද මධ්‍යම ආසියාවෙන් ද වහා ම ඉවත් කර ගනු! සමාජවාදී සමානතා පක්ෂය එසේ කියා සිටී. ඉරාකයට හා ඇෆ්ඝනිස්ථානයට එරෙහි ආක්‍රමන සකසා සූදානම් කල බුෂ්, රම්ස්ෆෙල්ඩ්, චෙයිනි ඇතුලු සියලු දෙනා යුද අපරාධ අධිකරනය වෙත පමුනුවා නඩු විසඳිය යුතු ය යි අපි ඉල්ලා සිටිමු. පෙන්ටගනය ද එක්සත් ජනපදයේ සහ සෙසු අධිරාජ්‍යවාදී රටවල යුද්ධ යන්ත්‍රයන් ද අහෝසි කොට ජන සංහාරක මහ අවි භංග කර දැමිය යුතු ය යි අපි කියා සිටිමු.

සමාජවාදී විදේශ ප්‍රතිපත්තියක් ජාත්‍යන්තර කම්කරු පන්ති සහයෝගිතාව මත යෝජනා කර සිටිමු. දියුනු කාර්මික රටවල තාක්ෂනය හා සම්පත් යෙදිය යුත්තේ ''තුන් වන ලෝක'' ජනතාව සූරා කෑමට හෝ සමූල ඝාතනය කිරීමට නො වේ. සකල ජනතාවගේ ජීවන මට්ටම් ඔසොවා ලෝක ඉතිහාසයේ ප්‍රථම වතාවට සැබෑ ලෝක පරිමාන සමාජ සමානතාව තහවුරු කිරීමට වේ.

## ප්‍රජාතන්ත්‍ර අයිතීන්ට එරෙහි ප්‍රහාරය

තමන්ගේ විදේශ පිලිවෙතේ මෙන් ම ස්වදේශ පිලිවෙතේ දී ද, බුෂ් පරිපාලනය එය විසින් කල් තබා සකස් කර ගැනී තිබුනු පලල් පියවර පරාසයක් ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යාජයක් ලෙස සැප්තැම්බර් 11 දිනය පාවිච්චි කොට තිබේ. ''ත්‍රස්තයට එරෙහි යුද්ධය'' නාමයෙන් ද එක්සත් ජනපද දේශප්‍රේමී පනත වැනි ද්විපාක්ෂික නීති සම්පාදනය මගින් ද එය නිර්දෝෂී භාවය පිලිබඳ පූර්ව-කල්පිතය, හබෙයාස් කෝර්පුස් අයිතිය, නීතිඥයෙකු ලබා ගැනීමේ අයිතිය, සහ ඉක්මන් නඩු විභාගයක් හා නඩු තීන්දුවක් ලබා ගැනීමේ අයිතිය අහෝසි කර ඇත.

ඇමරිකානු පොලිස් රාජ්‍යයක යටිතල ව්‍යුහය පිහිටුවා ගනු ලැබෙමින් පවතී: ස්වදේශ ආරක්ෂක දෙපාර්තමේන්තුව, පෙන්ටගනයේ උතුරුදිග විධානය, මහාද්වීපික එක්සත් ජනපදයේ හමුදා සංකේන්ද්‍රනය, සහ කියුබාවට අයත් ගුවන්තනාමෝ වරායේ හිර කඳවුර ඒවා ය. ජෝස් පදිල්ලා සහ යසාර් හම්දි රඳවා තබා ගැනීම පිලිබඳ නීතිමය තර්කවල දී බුෂ් පරිපාලනය විසින් මුලු මහත් එක්සත් ජනපදය ම ජනාධිපතිට මිලිටරි ඒකාධිපතියෙකු ලෙස, ඇමරිකානු පුරවැසියන් කිසිදු නීතිමය පරීක්ෂනයකින් තොරව අත් අඩංගුවට ගෙන සිර කර තැබීමේ අධිකාරය පවතින්නා වූ යුද කලාපයක් ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබ ඇත.

ප්‍රජාතන්ත්‍ර අයිතීන්ට එරෙහි මෙම පෙර නුවූ විරූ ප්‍රහාරය හුදෙක් ජෝර්ජ් ඩබ්ලිව්. බුෂ් හෝ ඇටෝර්නි ජෙනරාල් ජෝන් ඇෂ්ක්‍රොෆ්ට්ගේ පෞරුෂය විසින් ගනු ලැබූ තීන්දුවක් නො වේ. එය වනාහි දශක තුනක් තුල එක්සත් ජනපදයෙහි සමාජ අසමානතාවේ

දැවැන්ත වර්ධනය තුලින් සිදු වූවකි.

සමාජය ආනාදි පොහොසතුන්ගෙන් සමන්විත කතිපයාධිකාරයකින් ද තමන්ගේ වියදම් පියවා ගැනීමට වලි කන කම්කරු පාන්තික හා මධ්‍යම පාන්තික ජනයා මහා සංඛ්‍යාවකින් ද ගැඹුරින් ම දෙකට පැලී පවතී. උග්‍ර වන්නා වූ සමාජ පීඩනය ප්‍රජාතන්ත්‍ර පාලන රූප තව දුරටත් පවත්වා ගෙන යා නො හැකි තත්වයක් උද්ගත කරයි. අවසාන විග්‍රහයේ දී, ප්‍රජාතන්ත්‍ර අයිතීන්ට එල්ල කරනු ලැබෙන ප්‍රහාරය පෙන්නුම් කරන්නේ තමන්ගේ දැවැන්ත ධනය මහා ජනයාගේ මහත් වැඩි කොටස තුල පවත්නා සමාජ ප්‍රයත්නයන්ට එරෙහිව ආරක්ෂා කර ගැනීමට යත්න දරන්නා වූ මූල්‍ය ප්‍රභුවක ආත්මාරක්ෂක යන්ත්‍රනය යි.

ඒකාධිපතිත්වය පිලිබඳ තර්ජනය වනාහි දිග් ගැසුනු ඓතිහාසික සන්තතියක මස්තකප්‍රාප්තිය යි. දෙවන ලෝක යුද්ධය අවසන් වූ තැන් පටන් ප්‍රජාතන්ත්‍ර අයිතීන්ට යලියලිත් ප්‍රහාර එල්ල වී ඇත. ඒවා නම් 1950 ගනන්වල මැකාර්තිවාදය, 1960 ගනන්වල එෆ්බීඅයි-සීඅයිඒ සංවිධාන රට තුල ඔත්තු බැලීම, 1970 ගනන්වල වෝටර්ගේට් සිද්ධිය, 1980 ගනන්වල ඉරාන-කොන්ට්‍රා කුමන්ත්‍රනය වේ. ක්ලින්ටන්ගේ ඩිමොක්‍රැටික් පාක්ෂික පරිපාලනය දුරදිග යන ප්‍රජාතන්ත්‍ර විරෝධී පියවර ගත්තේ ය. එක්සත් ජනපද දේශප්‍රේමී පනතේ බොහෝ අංග ක්ලින්ටන්ගේ 1996 ත්‍රස්ත විරෝධී පනත තුල ඇතුලත් විය. එය තවතවත් මරන දන්ඩනයන් ද රහස් උසාවි ද මහා පරිමාන පිටුවාහල් කිරීම ද සඳහා මග පාදා දුනි.

පෙර කාල පරිච්ඡේදයක දී — වෝටර්ගේට් සිද්ධිය වැනි — ව්‍යවස්ථානුකූල පටිපාටින් උල්ලංඝනය කිරීමට දරන ලද ප්‍රයත්නයන්ට පාලක පන්තිය තුල ම කොටස්වලින් සැලකිය යුතු විරුද්ධත්වයක් එල්ල විය. මෙම ප්‍රහාර වඩවඩාත් උග්‍ර වූ — පාලක ප්‍රභුව හා කම්කරු පන්තිය අතර පරතරය වඩවඩාත් පුලුල් වූ — තතු තුල ඒවාට (පාලක පන්තිය තුලින් එල්ල වන) විරුද්ධත්වය ද එන්නඑන්න ම දුර්වල වී තිබේ. ක්ලින්ටන් පාලනය අස්ථාවර කොට අන්තිමේ දී එය දෝෂාභියෝගයට ලක් කිරීම දක්වා වූ වැඩ පිලිවෙලට කිසිදු සැලකිය යුතු විරුද්ධත්වයක් එල්ල වූයේ නැත. 2000 ඡන්ද විමසීම මාධ්‍යවල ද ආධාර ඇතිව සොරා ගැනීම, සහ ඩිමොක්‍රැටික් පක්ෂ සංස්ථාපිතය ඊට දන ගැසීම පෙන්නුම් කලේ පාලක ප්‍රභුවේ මොන ම කොටසකට හෝ ප්‍රජාතන්ත්‍ර අයිතීන් රැකීමේ බරපතල උවමනාවක් නො තිබුනු බව ය.

බුෂ් පාලනය වචනයේ පරිසමාප්ත අර්ථයෙන් ම නියෝජනය කරන්නේ ඇමරිකානු පාලක ප්‍රභුවේ සාපරාධී ස්තරයක් බලයට පත් වීම ය. මෙය වනාහි ඡන්දය පැරදී ද ශ්‍රේෂ්ඨාධිකරනය විසින් බලයට පත් කරනු ලැබූ, ඡන්දයෙන් තෝරා පත් කර ගනු නො ලැබූ ආන්ඩුවකි. එය රට ගෙන යන්නේ ප්‍රකෝපකරනය මගිනි. ඒ සඳහා සැප්තැම්බර් 11 දා භයංකර සිද්ධීන් අන්ත-දක්ෂිනාංශික න්‍යාය පත්‍රයක් සඳහා කෝකටත් යුක්තිකරනයක් ලෙස යොදා ගනු ලැබේ. ඒ සමග ම, එම දිනයේ දී එක්සත් ජනපද රහස් ඔත්තු සේවා දන්නා හඳුනන ත්‍රස්තවාදීන්ට නිදහසේ කටයුතු කිරීමට ඉඩ දුන්නේ මන්ද, ගුවන් යානා හතරක් එක් වර පැහැර ගැනුනු විට මිලිටරිය නිකම් සිටියේ මන්ද, ප්‍රහාරයක් පිලිබඳ කලින් කෙරී තිබුනු අනතුරු ඇඟවීම බුෂ් පාලනය විසින් නො තකා හැරුනේ මන්ද යනාදිය පිලිබඳ බරපතල පරීක්ෂනයක් පැවැත්වීම එය විසින් වලක්වා දමනු ලැබ ඇත.

කල්පවිනාශයක් වැනි ''ත්‍රස්තයට එරෙහි යුද්ධය'' මත තම දේශපාලන පන රැක ගැනීම පදනම් කිරීමට බුෂ් විසින් ගනු ලැබූ තීන්දුව ඇමරිකානු ජනයාට ඉතා අසුබ ඇඟවුම් දරා සිටී. මහජන විරෝධය කොතරම් වුවත් බුෂ් පාලනය සිය කැමැත්තෙන් බලය අත හරිනු ඇතැයි කල් තබා විශ්වාස කර ගැනීමට හේතුවක් නැත. 2004 ඡන්ද ව්‍යායාමය තුල දී වත්මන් ජනාධිපතිවරයාගේ ආන්ඩුව එක්සත් ජනපදය තුල අලුත් වඩාත් භයානක ත්‍රස්ත ප්‍රහාරයක් සූදානම් කරනු ඇතැයි සැබෑ අන්තරායක් පවතී. විශේෂයෙන් ම ඡන්දයෙන් දිනීමේ බුෂ්ගේ අවස්ථා අඩු වී යතැයි පෙනී ගිය හොත් මෙය මෙසේ වීමට ඉඩ ඇත. එවන් ප්‍රහාරයක් ඇති වුව හොත් නොවැම්බර් 2 දාට නියමිත ජනපතිවරනය කල් දමනු ඇතැයි හෝ යුද නීතිය යටතේ පැවැත්වෙනු ඇතැයි ඇඟවීම එක්සත් ජනපද මාධ්‍ය තුල දැනට ම පල කෙරී තිබේ.

## ප්‍රජාතන්ත්‍ර අයිතීන් හා සමාජවාදය සඳහා අරගලය

ප්‍රජාතන්ත්‍ර අයිතීන් ආරක්ෂා කිරීම සඳහා අත්‍යවශ්‍ය වන්නේ අතිශයින් ම ප්‍රතිගාමී දේශපාලන හා සමාජ බලවේගයන් උසි ගන්වා ගෙන බුෂ් පාලනය අතීතයේ ප්‍රගතිශීලී ප්‍රතිසංස්කරනයන් ආපසු පෙරලා දැමීමට දරමින් සිටින්නා වූ යත්නයට එරෙහිව ප්‍රතිප්‍රහාරයක් දියත් කිරීම ය. අතීත ප්‍රජාතන්ත්‍ර හා සමාජ ජයග්‍රහනයන් ආරක්ෂා කිරීමේ ලා සමාජවාදී සමානතා පක්ෂය වෙහෙස නො තකයි. —සමාජ හා ඡන්ද අයිතීන්, සැමට පොදු අධ්‍යාපනය, වැඩිහිටියන්ගේ සෞඛ්‍ය රක්ෂනය යනාදි මෙම අයිතීන් ද — සිවිල් අයිතිවාසිකම් ව්‍යවස්ථාව මගින් ආරක්ෂා කර ලීම ද මීට ඇතුලත් ය.

සමාජවාදී සමානතා පක්ෂය සියලු දෙනාට ම සමාන අයිතිවාසිකම් ඉල්ලා සිටී. රැකියා, නිවාස, අධ්‍යාපනය සහ අනෙකුත් ක්ෂේත්‍රයන්හි රැස, ජාතික ප්‍රභවය, ආගම, ලිංගිකත්වය සහ ලිංගික හුරුව මත කෙරෙන සියලු වෙනස්කම්වලට සමාජවාදී සමානතා පක්ෂය විරුද්ධ වේ. ගැහැනුන්ට තමන්ගේ කැමැත්ත පරිදි ගබ්සා කර ගැනීමට ඇති අයිතිය ආරක්ෂා කරන අතර සමලිංගික විවාහ කර ගැනීමට අයිතියක් තිබිය යුතු ය යි ද සමානතා පක්ෂය කියා සිටී.

එහෙත්, ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සිවිල් අයිතීන් හා ව්‍යවස්ථානුකූල රීතීන්ට එරෙහි ප්‍රහාරයන් පරාජය කිරීමේ තනිකර-වැලකුම් ප්‍රයත්නයට

සීමා කල නො හැකි ය. ප්‍රජාතන්ත්‍ර අයිතීන් පිලිබඳ සංකල්පය ම නීතිය ඉදිරියේ සමානතාවය සහ නිසි පටිපාටියේ පටු රාමුවෙන් ඔබ්බට ප්‍රසාරනය කල යුතු ය. එය ට පලල් වැඩ කරන ජනතාවගේ ජීවිතයේ යථාර්ථය පිලිබඳ සියලු අංශවලට අදාල විය යුතු ය.

ප්‍රජාතන්ත්‍ර අයිතීන් ආරක්ෂා කිරීම පෞද්ගලික දේපොල එක තැන ගොඩ ගසා ගැනීමට එරෙහි අරගලයකින් කිසි සේත් ම වෙන් කර ගත නො හැකි වේ. සමාජ හා ආර්ථික අසමානතාව කා වැදී ඇති සමාජයක් තුල නීතිය ඉදිරියේ සමාන අයිතිවාසිකම් ගැන කෙරෙන කතා තුල අතිමූලික වංචනික බවක් පවතී. රක්ෂාවක් තිබේ ද පඩිය කීය ද වැඩ කරන්නේ කුමන තතු තුල ද යනාදිය පිලිබඳව දෛනික ජීවිතයේ ඉතා ප්‍රධාන අංශ සියල්ලක් ම පාහේ මූල්‍ය කතිපයාධිකාරයක් විසින් අන දී පාලනය කෙරෙන තතු තුල අවුරුදු දෙකකට හෝ හතරකට හෝ වරක් ඡන්දය පාවිච්චි කිරීමේ අයිතියට ඇති තේරුමක් නැත.

ප්‍රජාතන්ත්‍රවාදයට ප්‍රගාඪ සමාජමය අන්තර්ගතයක් කා වැද්දිය යුතු ය. තමන්ගේ කාලයෙන් හා ආයාසයෙන් වැඩි කොටසක් බොහෝ දෙනා විසින් ගත කෙරෙන්නේ වැඩපොල තුල ය. ඔවුන්ගේ වැඩ තත්වයන්, ආරක්ෂාව, වැටුප්, සේවයට බඳවා ගැනීමේ කොන්දේසි, සහ ව්‍යවසාය නායකත්වය සියලු සේවකයන්ගේ ඡන්දයක් මගින් සම්මත කර ගත යුතු ය. වානිජ තීන්දු මුලුමනින් ම පාරදෘශ්‍ය විය යුතු ය. මහා ව්‍යවසායවල නායකත්වය සියලු සේවකයන්ගේ ප්‍රජාතන්ත්‍ර ඡන්දයකින් අනුමත කල යුතු ය.

අවසාන විග්‍රහයේ දී, ප්‍රජාතන්ත්‍රය ආරක්ෂා කොට ප්‍රසාරනය කිරීම රඳා පවත්නේ සමාජවාදය සඳහා අරගලයට කම්කරු පන්තිය බලමුලු ගැන්වීම තුල ය.

## ඇමරිකානු සමාජයේ අර්බුදය

2004 වසරේ ඇමරිකාව, ඉන් පෙර කවර කලෙකට වත් වඩා ආර්ථික වශයෙන් තියුනු ලෙස ධ්‍රැවීකරනය වී තිබේ. පෝසතුන් වඩවඩාත් පෝසත්ව ඇති අතර දුප්පතුන් වඩවඩාත් දුප්පත් වී ඇත. තමන් ''මධ්‍යම පන්තිකයන්'' ය යි සලකා ගත් වැඩි වන පවුල් සංඛ්‍යාවක් වැඩෙන ආර්ථික අනාරක්ෂිත බවකටත් සිය ජීවන තත්වයන් වඩවඩාත් පහතට ඇද දමනු ලැබීමටත් මුහුන දෙන අතර පොහොසතුන් හා දුප්පතුන් අතර පරතරය එන්නඑන්න ම පලල් වෙයි.

ඇමරිකානු සමාජයේ මුලු ධනයෙන් සියයට 40කට වැඩි කොටසක් පෝසත් ම සියයට එක් දෙනාට අයිති ය. කොටස් හා ව්‍යාපාර වස්තු වැනි මූල්‍ය වත්කම්වලින් සියයට 80කට වැඩි කොටසක් මේ ඉහල ම සියයට එක සතු ය. මේ සියයට එක ලබන කොටස ක්‍රමයෙන් වැඩි වනු දක්නට ඇත. 2002 වසරේ දී මේ සියයට එක තුල ඉහල ම දහයෙන් පංගුවේ, එනම් පොහොසත් ම ගෘහයන්ගේ ආදායම ඩොලර් බිලියන 505ක් විය. මේ අනුව, මේ එක් ගෘහයක සාමාන්‍ය ආදායම ඩොලර් මිලියන 4ක් විය. මේ අතරවාරයේ, සියලු ම වැටුප් ලබන කම්කරුවන්ගෙන් හතරෙන් පංගුවක් උපයා ගන්නේ පැයකට ඩොලර් 8කුත් ශත 70කට අඩු වේතනයකි. මේ සීමාව වූ කලි පූර්න කාලීන කම්කරුවෙකු නිල වශයෙන් ලබන දිලිඳු වැටුප් ප්‍රමානය යි.

ඇමරිකානු පාලක ප්‍රභූව තොරතෝංචියක් නැතිව ප්‍රකාශ කරන පරිදි, එක්සත් ජනපදය ලෝක ඉතිහාසය තුල ඇති වූ පොහොසත් ම රට වේ. එක්සත් ජනපද දල දේශීය නිෂ්පාදිතය ඩොලර් ට්‍රිලියන 11කට අධික වේ. එක් කම්කරුවෙකුගේ වාර්ෂික නිමැවුම් සාමාන්‍යය ඩොලර් 90,000කට ආසන්න වේ. යෝධ සංස්ථා හා ඩොලර් බිලියන ගනන් වත්කමැති පුද්ගලයන් මගින් ඇමරිකානු ආර්ථික දිවිය කෙතරම් විකෘත කොට ඇත් ද යත්, මේ ධනය නිපදවන කම්කරු ජනයාගේ ඉතා ම මූලික අවශ්‍යතාවන් පවා සපුරා ලීමට මේ දැවැන්ත සම්පත් උපයෝගි කර ගත නො හැකි ය.

**රැකියා:** මිලියන 9කට අධික කම්කරු සංඛ්‍යාවක් නිල වශයෙන් සේවා වියුක්තයෝ ය. තවත් මිලියන 5ක් වර්ගීකරනය වන්නේ ''අධෛර්යමත් වූ අය'' ලෙස, ගනනයට අයත් නො වූවන් සේ ය. මීට අමතරව, මිලියන 25ක ජනකායක් අර්ධ-කාලීන සේවාවන්හි යෙදෙති. පොදුවේ ගත් කල ඔවුන් සේවය කරන්නේ අඩු වැටුපකට, ප්‍රතිලාභ නොමැතිව ය. 2001 ජනවාරියෙහි බුෂ් ධවල මන්දිරයට ඇතුලු වීමෙන් අනතුරුව නිෂ්පාදනයට සම්බන්ධ රැකියා මිලියන 2.5කට අධික සංඛ්‍යාවක් අතු ගෑවී ගොස් ය. මහා අවගතයෙහි දී හර්බට් හූවර්ගෙන් පසුව, තම මුලු සිව් වස් කාල සීමා අධීක්ෂනය යටතේ රැකියාවන්හි ශුද්ධ අඩු වීමක් වාර්තා කල ප්‍රථම ජනාධිපති බුෂ් වනු ඇත.

**ජීවන තත්වයන්:** 2002 වසරෙහි, මධ්‍යන ගෘහ ආදායම සියයට 2.2ක ප්‍රමානයකින් පහත වැටුනි. නිෂ්පාදන අංශයෙහි රැකියා අහිමි වීම හේතු කොට ගෙන මැද-බටහිර ප්‍රදේශය විශාලතම පහත වැටීම වන සියයට 3.7ක ප්‍රමානයක් වාර්තා කලේ ය. පසු ගිය වසර 30 තුල මූර්ත වැටුප් නිශ්චලනය වී ඇත, එසේත් නැත් නම් පිරිහී ඇත. මේ කාල වකවානුව තුල, 1973 වසරේ සිට, නිවාස උකස් පිරිවැය, සාමාන්‍ය පිරිමි කම්කරුවෙකුගේ වැටුප් මෙන් 70 ගුනයකින් ශීඝ්‍රව ඉහල නැග ඇත. තම බිල්පත් ගෙවීම සඳහා පමනක් ඇමරිකානු කම්කරුවන්ට වැඩි වන පැය ගනන් සේවය කිරීමට සිදු වී ඇත. 1973 වසරේ දී සාමාන්‍ය පූර්න කාලීන කම්කරුවෙකු වැඩ කල පැය ගනන වසරකට 1,720ක් වූ අතර, 1998 වන විට මෙය වසරකට පැය 1,898ක් දක්වා වැඩි විය. මෙය, පැය 178ක නැග්මකි. මේ වැඩි පැය ගනන, වසරකට අමතර සති හතරක් වැඩ කිරීම හා සමාන වේ.

**ආර්ථික අනාරක්ෂිත බව:** කම්කරු පාන්තික හා මධ්‍යම පාන්තික ප්‍රධාන මූල්‍ය බර වන පාරිභෝගික නය, 1946 වසරෙහි දී ආදායමෙන් සියයට 22ක ප්‍රමානයක සිට අද වන විට සියයට 110ක ප්‍රමානයක් දක්වා ශීඝ්‍රයෙන් වර්ධනය වී ඇත. සාමාන්‍ය පවුලක

නය සියයට 53ක ප්‍රමාණයකින් නැගීමත් සමග, 1989 වසරේ සිට 2001 වසර දක්වා මුලු ක්‍රෙඩිට් පත් නය තුන් ගුනයකින් වැඩි විය. පසු ගිය සිව් වසර තුල පමනක්, ගෘහ නය ඩොලර් ට්‍රිලියන 6.5ක සිට ඩොලර් ට්‍රිලියන 8.7ක් දක්වා නැග ඇත. මේ නැග්මට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ හදිසි බිල්පත් ගෙවීම සඳහා මුදල් ලබා ගැනීම මධ්‍යම පාන්තික පවුල් තම නිවෙස් වල උගස් අලුතින් වැඩි කර මුදල් ලබාගැනීම යි.

**දිළිඳු බව:** විද්‍යාව, තාක්ෂනය හා ශ්‍රම ඵලදායිතාවෙහි අතිවිශාල දියුනු වීම් ඇති වුව ද සාගින්නට, නිවෙස් අහිමිකමට හා දිළිඳු බවට මුහුන දෙන ඇමරිකානුවන්ගේ සංඛ්‍යාව දෙවන ලෝක සංග්‍රාමයෙන් පසු කිසි කලෙක නො වූ විරූ අන්දමට වර්ධනය වී ඇත. 2002 වසරේ දී දිලින්දන් ලෙස දිවි ගෙවන සංඛ්‍යාව මිලියන 1.3කින් වැඩි වී මිලියන 35 දක්වා නැංගේ ය. නගර හා පුනාායතන හදිසි කෑම සහ නිවෙස් සඳහා ඉල්ලුම තියුනු ලෙස වැඩි වූ බවට වාර්තා කරන අතර, දුප්පතුන් වෙනුවෙන් ආන්ඩුවේ වැඩ පිලිවෙලවල් ප්‍රපාතකර ලෙස කපා දමා ඇත.

**සෞඛ්‍ය උපස්ථායක සේවා:** සෞඛ්‍ය රක්ෂනය නොමැතිව ඇමරිකානුවෝ මිලියන 43කට වැඩි සංඛ්‍යාවක් වෙසෙත්. විශේෂයෙන් වෛද්‍යවරුන් විසින් නියමකෙරෙන ඔසු සඳහා සෞඛ්‍ය උපස්ථායක සේවා වෙනුවෙන් අහස උසට නගින පිරිවැයට කෝටි සංඛ්‍යාත ජනකායක් මුහුන දෙති. කම්කරු පන්ති පවුල් වැඩි සංඛ්‍යාවකට සේවා විරාමයක ප්‍රතිඵලය වන්නේ ආදායම අහිමි වීම පමනක් නො ව, සෞඛ්‍ය රක්ෂනය ද අහිමි වීම යි. 2002-2003 වසර තුල දී, ඇමරිකාවේ ප්‍රාන්තවලින් තුනෙන් දෙපංගුවක් දුප්පතුන් වෙනුවෙන් වෙන් කර ඇති සෞඛ්‍ය ආධාර ප්‍රතිලාභ කපා හැරී ය, එසේත් නැත් නම්, එම ආධාරවලට ඇති හිමිකම් අඩු කර හැරී ය. එමගින් මිලියන දෙකකට ආසන්න ජනකායකට මේ ආවරනය අහිමි විය. මින් බහුතරය වූයේ ළමුන් ය.

**විශ්‍රාමයෙහි සුරක්ෂිත භාවය:** සංස්ථා විශ්‍රාම අරමුදල් කොල්ල කත් ම, 401(k) ගිනුම්වල අගය බරපතල ලෙස පහත වැටෙත් ම, වෝල් ස්ට්‍රීට් හා බුෂ් පාලන තන්ත්‍ර සමාජ සුරැකුම පුද්ගලීකරනය සඳහා ඉලක්ක කර ගනිත් ම, ගෞරවනීය විශ්‍රාම ගැන්මකට ඇති තම අයිතියට එරෙහිව නැගී එන තර්ජනයකට වැඩිමහලුන් අතරින් කෝටි ගනන් ජනයා මුහුන දෙති. කොන්ග්‍රසය විසින් පැනවී බුෂ් විසින් අත්සන් තබන ලද සෞඛ්‍ය උපස්ථායක ''ප්‍රතිසංස්කරන'' පනත වූකලි වැඩිමහල්ලන්ට සෞඛ්‍ය උපස්ථානය සහතික කරන වැඩ පිලිවෙල පුද්ගලීකරනයට ලක් කොට එය විනාශ කර දැමීමේ ප්‍රථම පියවර යි.

**අධ්‍යාපනය:** 2000 වසරේ දී, උපාධිය ලැබීමට පෙරාතුව ඇමරිකානු තරුනයන්ගෙන් සියයට 30ක් උසස් අධ්‍යාපනය ලබා දෙන පාසල් අත් හැර ගියහ. මෙය 1990 වසරේ දී සියයට 26ක ප්‍රමානයක සිට නැග්මකි. ෆෙඩරල් හා ප්‍රාන්ත අරමුදල් කපා හැරීම හේතු කොට ගෙන විෂය බාහිර ක්‍රියාකාරකම්, සිත්තම්, භාෂාව හා අනෙකුත් උපදේශක වැඩ පිලිවෙලවල් ඉවත් කෙරී ඇත. පාසල් ගොඩනැගිලි දසදහස් ගනනින් කඩා වැටෙමින් හා අන්තරායදායකව පවතී. 2001 වසරේ දී කොන්ග්‍රසය විසින් ද්විපාක්ෂික සහාය සහිතව අනුමත කරන ලද ''කිසිදු ළමයෙකු අතපසු නො කර තැබීමේ'' වැඩ පිලිවෙල, පොදු අධ්‍යාපනයට යටින් වල කැපීම සඳහාත් ප්‍රසිද්ධ පාසල් වසා දැමීමට බල කිරීම සඳහාත් ඕනෑකමින් ගන්නා ලද වැයමකි. ඉගැන්වීම සඳහා ඉහල නගින වියදම් හා මූල්‍ය ආධාර කප්පාදු කිරීම ඉදිරියේ මැදි ආදායම් ලබන පවුල්වලට පවා උසස් පාසල් අධ්‍යාපනය වැඩිවැඩියෙන් ලබා ගත නො හැකි තත්වයක පවතී.

**සමාජ යටිතල පහසුකම්:** අයවැය ලේඛන කප්පාදු කිරීම් හා කිසිදු වැදගත් සමාජ ආයෝජනයකට ඉඩ තැබීම ධනවත් ප්‍රභුව විසින් ප්‍රතික්ෂේප කරනු ලැබීම හේතු කොට ගෙන ඇමරිකානු මහා මාර්ග, පාලම්, පොදු ප්‍රවාහන, ජලය හා ජලාපවහන පද්ධති හා අනිකුත් සමාජ යටිතල පහසුකම් කඩා වැටෙමින් පවතී. ඉතාම උග්‍ර අර්බුදයක් ඇත්තේ ප්‍රාන්ත ආන්ඩු තුල ය. මේවා 2004 වසරේ මුහුන දුන් සංයුක්ත රාජ්‍ය මූල්‍ය හිගය ඩොලර් බිලියන 80කි. ප්‍රාන්ත ආන්ඩු පුස්තකාල වසා දැමීමේ සිට සිර ගෙවල නිවැසියන්ගේ කෑම වේල් හකුලුවා ලීම දක්වා පරාසයක කප්පාදු කිරීම් ක්‍රියාත්මක කොට ඇත. ඊසාන හා මැද-බටහිර පෙදෙස්වල අගෝස්තු මස ඇති වූ බලශක්ති ඇනහිටීම් මගින් ප්‍රදර්ශනය වූ පරිදි, කාර්තුවක් පාසා ලාභ උපරිම කර ගැනීම සඳහා වෝල්වීදියේ බලපෑම යටතේ, නඩත්තු කටයුතු සඳහා අවශ්‍ය ආයෝජන කිරීමට පුද්ගලික අයිතියට යටත් උපයෝගිතා අපොහොසත් වී ඇත.

**සිර ගෙවල් :** 2000 වසරේ දී, මිලියන 2.1කට අධික ඇමරිකානුවන් සංඛ්‍යාවක් සිරගතව සිටියහ. මෙය 1980 වසර තුල සිරගතව සිටි සංඛ්‍යාව මෙන් සිව් ගුනයක් වන අතර ප්‍රාන්ත 16ක ජනගහනයටත් අධික ය. අනිකුත් ඕනෑම කාර්මීකරනයකට ලක් වූ රටකට වඩා සිය ජනගහනයෙන් වැඩි සමානුපාතිකයක් එක්සත් ජනපදය සිරගත කරයි. තව ද, එය මරන දන්ඩනය නමැති ම්ලේච්ඡ අභ්‍යාසය තව මත් ක්‍රියාත්මක කරන රටවල් කිහිපයෙන් එකකි. 1980 වසරේ සිට 2000 වසර දක්වා සිරගත වූ කලු මිනිසුන්ගේ සංඛ්‍යාව 143,000 සිට 792,000 දක්වා නැංගේ ය. උසස් පාසල් මට්ටමේ අධ්‍යාපනය ලබන සංඛ්‍යාවට වඩා කලු මිනිස්සුන් සංඛ්‍යාවක් සිරගතව සිටිති.

**තරුනයන් සඳහා තත්වයන්:** අවුරුදු 16 සිට 24 දක්වා වයසැති මිලියන 5.5ක සංඛ්‍යාවක් පාසල්වලින් ඉවත් වී රැකියා නොමැතිව කල් ගෙවති. මොවුහු සාරභූතව ඇමරිකානු සමාජය විසින් අත්හරින ලද පුද්ගලයෝ වෙති. නිවෙස්වලින් පැන ගිය හෝ නිවෙස් අහිමි තරුනයෝ මිලියන 1.3ක් පමන ඇමරිකානු වීථිවල දිවි ගෙවති. පහර දීම්, රෝග හෝ සිය දිවි නසා ගැනීම් හේතු කොට ගෙන වසරක් පාසා 5,000ක්

දෙනා මිය ඇදෙති. බාල අපරාධ සංඛ්‍යාව ප්‍රපාතකර ලෙස පහත වැටුන ද 1990 ගනන්වල දී සිරගත වූ බාලයන් සංඛ්‍යාව සියයට 74ක ප්‍රතිශතයකින් වැඩි විය. ළමයි දසලක්ෂ 4ක් තරම් විශාල සංඛ්‍යාවක් මානසික රෝගවලින් පෙලෙති. මානසික සෞඛ්‍යය සඳහා ප්‍රතිකාර ගැනීමේ එක ම මග ලෙස තම ළමුන්ගේ භාරකාරත්වය ප්‍රාන්ත පාලනයන්ට පැවරීමට දෙමව්පියන් දස දහස් ගනනකට බල කෙරී ඇත.

බුෂ් පාලන තන්ත්‍රයෙහි ප්‍රතිපත්ති, ආර්ථික අසමානතාව උග්‍ර කර අත්‍යවශ්‍ය පොදු සේවා සඳහා වැය කිරීම් සීමා කර ඇත. 2001 වසරෙහි ඩොලර් ට්‍රිලියන 1.35ක බදු කප්පාදුවෙන් ද 2003 වසරෙහි දෙවන වට කප්පාදු කිරීම්වලින් ද විශාල වැඩි කොටස අයත් වූයේ ජනගහනයෙන් ඉහල ම සියයට එකට ය. මේ අතරවාරයේ, දේශීය සමාජ අවශ්‍යතා වෙනුවෙන් මූර්ත ෆෙඩරල් වැය කිරීම් ප්‍රශ්නකර ලෙස කපා දමා ඇත.

පුද්ගලික වගකීම පිලිබඳ දර්ශනය පනවා ඇත්තේ සුභසාධන ලබන්නන්, සේවා වියුක්තිකයන් හා තරුනයන් මත පමනි. ව්‍යාපාරික ඇමරිකාවේ ඉහල ම තරාතිරම්වල වැජඹෙන අයවලුන්ට එය අදාල නො වේ. එම තරාතිරම්වල සම කල නො හැකි ආකාරයේ අපරාධ ක්‍රියාවලියක් සිදු කෙරී ගෙන යයි. ප්‍රධාන විධායක නිලධාරීන් හා ව්‍යාපාරික ලොවේ අනිකුත් විධායක නිලධාරීන් සිය ගනන් සිය සමාගම් කොල්ල කා, මිලියන සිය ගනනින් හා බිලියන ගනනින් පවා සිය පුද්ගලික සම්පත් තර කර ගෙන ඇති අතර ඒ සඳහා මිල ගෙවා ඇත්තේ කම්කරුවන් හා කුඩා කොටස්කරුවන් ය. එන්රොන් සමාගම වූ කලි ව්‍යාපාරික ලොවේ අපරාධකරුවන් අතරින් වඩාත් අපකීර්තිමත් හා බුෂ්ට වඩාත් සමීප සබඳකම් ඇති සමාගම පමනි. ටයිකෝ, වර්ල්ඩ්කොම්, ග්ලෝබල් ක්‍රොසිං, කේමාර්ට්, බොයිං, මෙරිල් ලින්ච්, සිටි ගෘප් හා හෙල්ත් සවුත්, යන ව්‍යාපාර ලොවේ යෝධයෝ ඊ හැනක් මේ ලැයිස්තුවට ඇතුලුවෙති. එක්සත් ජනපද ඉතිහාසය තුල ඇති වූ විශාලතම බංකොලොත් භාවයන්ගෙන් 10කින් 9ක් ම ඇති වූයේ බුෂ් ජනාධිපති වශයෙන් පත් වීමෙන් අනතුරු ය. ඩොලර් බිලියන සිය ගනන් කොල්ල කා ඇත. එසේත් නැත් නම්, අහිමි වී ඇත. වැරදිකරු ලෙස ප්‍රකාශ කර සිරගත වීම පසෙක තිබියේවා, අත් අඩංගුවට ගෙන ඇත්තේ ඉහල පෙලේ විධායක නිලධාරීන් අතලොස්සක් පමනි.

මෙහි පවත්නේ අපේරනයක් (අහඹු සුවිශේෂතාවක්) නො වේ, සමාජ ව්‍යාධියක රූපාකාරයකි: එනම්, ඇමරිකානු සංගත ප්‍රභූවේ සාපරාධකරනය යි. (අපරාධකරුවන් බවට පත් වීම යි.) මෙම සන්තතියේ වෛෂයික උල්පත පවත්නේ ඇමරිකානු ධනවාදයේ දිග් ගැසුනු අර්බුදය තුල ය: මෙය 1970 ගනන්වල ලාභානුපාතිකය, විශේෂයෙන් ම කාර්මික නිෂ්පාදනයෙහි ලා පහත වැටීම සමග ආරම්භ විය. පාලක පන්තිය මෙයට ප්‍රතිචාර දැක්වූයේ 1980 ගනන් පුරා රැකියා හා වැටුප් කපා දමමින්, වෘත්තීය සමිති කුඩු කර දමමින්, මහා සංගතවල හා ධන කුවේරයන්ගේ බදු කපා වාසි සලසා දෙමින් මහා සමාගම්වලට පනවා තිබුනු සීමා රෙගුලාසි කපා දමමිනි. පැරනි කම්කරු සංවිධානවල බිඳ වැටීම ද සමග තමන්ට පුද්ගලික ධනය ඒකරාශි කර ගැනීම සඳහා පැවති සියලු ම සමාජමය, දේශපාලන පමනක් නො ව සදාචාරාත්මක පවා සීමාවන්ගෙන් තමන් නිදහස්ව ඇති බව පාලක ප්‍රභූවට එන්නඑන්න ම හැඟී ගියේ ය. ධනපති නිෂ්පාදන ක්‍රමයේ පදනමේ පවත්නා කම්කරු ශ්‍රම ක්‍රියාවලියෙන් ලාභය උකහා ගැනීමේ අනුපාතිකය පහතට ඇද දැමීමට තුඩු දෙන්නා වූ ප්‍රතිසතිතතාවන් පරයා ලීමට මෙම පියවරයන්ට ද බැරි විය. මෙහි ප්‍රතිඵලය වූයේ 1990 ගනන්වල දී මහසංගත ඇමරිකාව මහා පරිමානයෙන් පරිපූර්න ප්‍රෝඩාවට බැස ගැනීම ය. බොරු ලාභ පෙන්වීම සහ කොටස් මිල පුම්බා ගැනීම සඳහා, කොම්පැනිවල ප්‍රධාන විධායකයන්ගේ ආදායම් උදුම්මා ගැනීම සඳහා ''ගනන්හිලවු පොත් තෙම්පරාදු'' කිරීමේ ඔවුහු යෙදී ගත්තාහ.

## කම්කරු පන්තිය ආරක්ෂා කිරීම සඳහා සමාජවාදී ක්‍රියා මාර්ගයක්

සමාජවාදී සමානතා පක්ෂය කම්කරු පන්තියේ අවශ්‍යතාව උදෙසා එක්සත් ජනපද සහ ලෝක ආර්ථිකය ප්‍රතිසංවිධානය කිරීම අරමුනු කොට ගත් ක්‍රියා මාර්ගයක් ඉදිරිපත් කරයි. කර්මාන්තයේ සහ මූල්‍ය සම්පාදනයේ සකල බලවේගයන් ම පෞද්ගලිකව ඇති කොට පෞද්ගලිකව පාලනය කරනු ලබන වත්මන් ධනේශ්වර පර්යාය ඉවත් කොට දමා, ඒ වෙනුවට ආර්ථිකය පොදු අයිතියට හා ප්‍රජාතන්ත්‍රවාදී පාලනයට යටත් කරන සමාජවාදී පද්ධතියක් පිහිටුවා ලිය යුතු ය. මානව අවශ්‍යතා සන්නිකර්ෂනය කිරීම අරමුනු කොට ගත්තා වූ ද ලාභ ගැරීම සහ මහා පෞද්ගලික ධනය ගොඩ ගසා ගැනීම අරමුනු කර නො ගන්නා වූ ද ආර්ථික පර්යායක් නිර්මානය කල යුතු ය යි අපි කියා සිටිමු.

පලල් වැඩ කරන ජනතාවගේ අවශ්‍යතාවලට ගැලපෙන පරිදි ආර්ථික ජීවිතය ප්‍රතිසංවිධානය කිරීම සඳහා ඩොලර් දසබිලියනයකට වැඩි සියලු ම පෞද්ගලික කාර්මික හා භාන්ඩ නිෂ්පාදන සංගත පොදු අයිතියට යටත් ව්‍යවසාය බවට පරිවර්තනය කල යුතු ය. එසේ කිරීමේ දී කුඩා කොටස්කරුවන්ට පූර්න වන්දි ගෙවනු ලබන අතර, මහා කොටස්කරුවන්ට ලැබෙන වන්දි එලි පිට සාකච්ඡා කොට නිගමනය කල යුතු ය. සියලු බැංකු සහ රක්ෂන සංස්ථා ජනසතු කල යුතු ය. ඊට අමතරව බලශක්ති සම්පාදනය, සහ සියලු තීරනාත්මක ස්වාභාවික සම්පත් පොදු අයිතිය සහ පාලනය යටතට පත් කල යුතු ය.

ඇමරිකානු ආර්ථිකය මෙම පිලිවෙත් අනුව ප්‍රතිසංවිධානය කිරීම වැඩ කරන ජනතාවගේ ජීවන තත්වයන් අර්ථභාරී ලෙස වඩා ලන්නා වූ ක්‍රියා මාර්ග

ක්‍රියාත්මක කිරීම උදෙසා සුවිසල් සම්පත් අත්පත් කර දෙනු ඇත.

දැනට විරැකියාවට පත්ව සිටින එහෙත් වැඩ කිරීමට හැකියාව ඇති සියලු දෙනාට රැකියාව සහතික කර දෙන ආකාරයකට යෝධ පොදු වැඩ පිලිවෙලක් ක්‍රියාත්මක කල යුතු ය. මිලියන සංඛ්‍යාත වැඩ කරන ඇමරිකානුවන්ගේ ආදායම ඉහල නංවා ලීම සඳහා මධ්‍යම ආන්ඩුව විසින් මුදල් සපයා, උද්ධමනයට අනුපාතව වැටුප් ඉහල දමන ආදායමක් තහවුරු කරනු ලැබිය යුතු ය.

එසේ ම, ඉහල ගුනාත්මක භාවයකින් යුක්ත වූ පොදු නිදහස් අධ්‍යාපනයක් ද සියලු දෙනාට නො මිලේ ඉහල අධ්‍යාපනය ලබා ගැනීමේ අයිතිය ද තහවුරු කල යුතු ය යි අපි කියා සිටිමු. සකල ජනයාට ම පරිපූර්න වෛද්‍ය පහසුකම්; සුවපහසු, මිලපහසු නිවාස ගොඩ නැගීම සඳහා රාජ්‍යයෙන් ආධාර මුදල් ලබා දීම; වෘත්තීය සමිතියකට බැඳීමට ඇති කම්කරුවාගේ අයිතිය තහවුරු කර ලීම; වෘත්තීය සමිති ප්‍රජාතන්ත්‍රවාදීව මෙහෙයවා ගැනීම සහතික කෙරෙන අයිතියක්, වෘත්තීය සමිති තලා දැමීමත් වැටුප් කැපීමත් නීති විරෝධී කිරීම; නීත්‍යානුකූලව හා ''නීති විරෝධීව'' විදේශවලින් පැමිනෙන ආගාමික කම්කරුවන් ද ඇතුලු සියලු දෙනාට පුරවැසි අයිතිය ද ඇතුලු පූර්න ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම්; සියලු වැඩ කරන ජනතාවට විශ්‍රාමයේ දී ආරක්ෂාව සහ යහපත් නිවසක්; කුඩා හා මධ්‍යම තරමේ ව්‍යවසායන්ට රාජ්‍ය ආධාර සැපයීම.

ඉහත සටහන් කරන ලද සමාජ අයිතීන් දිනා ගත හැක්කේ සමාජ සමානතාවය පෝෂනය කිරීම සඳහා සංයුක්ත පියවරයන් ගැනීම තුලිනි. බදු ප්‍රතිපත්තිය යටිකුරු කර දැමිය යුතු ය. එය මහ ජනතාවගෙන් කොල්ලකා කෝටිපතියන් ද මහා ජාවාරම් ද පෝසත් කිරීමේ මාධ්‍යයක් නොව ධනය සමූලව යලි බෙදා හැරීමේ උපකරනයක් විය යුතු ය. මෙහි අර්ථය නම් රොනල්ඩ් රීගන් මහ ජෝර්ජ් බුෂ් සහ ජෝර්ජ් ඩබ්ලිව් බුෂ් යටතේ මහ ධනවතුන්ට ලබා දෙන ලද අයබදු කැපීම අහෝසි කර දැමීම ය; ධනය මත කෙලින් බදු එනම්: දේපල බද්ද - යලිත් ස්ථාපිත කල යුතු ය. තමන්ගේ ලාභවලින් ඉතා සුලු කොටසක් පමනක් ගෙවා මගහැර පැන යාමට බොහෝ සංගතයන්ට ඉඩ සලසන සිදුරු හා ගනකාධිකරන ගැට අහෝසි කර දැමිය යුතු ය. අති මහත් ජනතාවගේ බදු අඩු කල යුතු ය. ඉහල ආදායම් හා එක්රැස් කල ධනය සතු අය ගෙවිය යුතු බදු තියුනු ලෙස වැඩි කල යුතු ය.

1990 ගනන්වල දී කම්කරුවන්ට හා කුඩා කොටස්කරුවන්ට පාඩු පමුනුවා සිදු කල සමපේක්ෂන ක්‍රියාවන් හා ප්‍රධාන විධායක නිලධාරීන් විසින් ව්‍යාපාරික සම්පත් සාපරාධී ලෙස අයිති කර ගනු ලැබීම ද පරීක්ෂා කිරීම සඳහා විශේෂ අවධානය යොමු කල යුතු ය. මේ සොරා ගත් ධනය යලි අත්පත් කර ගෙන සමාජ සේවා හා කම්කරු පන්ති ජීවන තත්වයන් දියුනු කිරීම සඳහා උපයෝගි කර ගත යුතු ය.

දේපොල පිලිබඳ අයිතිවාසිකම් සමාජ අයිතිවාසිකම්වලට ද්විතීයික කල යුතු ය. මින් අදහස් වන්නේ සියලු දෑ ජනසතු කල යුතු බවක් හෝ යෝධ සංස්ථා හා බැංකු මගින් අඛන්ඩව පීඩාවට ලක් කෙරෙන කුඩා හෝ මධ්‍යම පරිමාන ව්‍යාපාර අහෝසි කල යඬු බවක් හෝ නො වේ. එවැනි ව්‍යාපාර සැහෙන වැටුප් හා ජීවන තත්වයන් සලසන තාක් කල් සැලසුම්ගත ආර්ථිකයක් ස්ථාපිත කිරීම තුලින් නය සහ වඩාත් ස්ථාවර වෙලඳ පොල තත්වයන් සඳහා පහසු ප්‍රවේශයක් ලබා දෙනු ඇත.

වැඩ කරන ජනතාවට කලාවට හා සංස්කෘතියට පූර්න ලෙස සහභාගී වීම සඳහා පියවර ගත යුතු ය යි ද සමාජවාදී සමානතා පක්ෂය කියා සිටී. කලෙක ඇමරිකානු පොදුජන සංස්කෘතිය ලෝකයේ පුදුමවලින් එකක් විය. එහි නව්‍යකරනයන් ද බලගතු ප්‍රජාතන්ත්‍රවාදී හා ධනවාදී අධ්‍යාසය ද නිසා එය ආකර්ෂන කේන්ද්‍රයක් ලෙස ක්‍රියා කලේ ය. අනෙකුත් ක්ෂේත්‍රවල දී මෙන් ම සංස්කෘතිය ද ලාභ චේතනාවන්ට යටත් කිරීම දැවැන්ත පිරිහීමකට මග පෑදී ය. කෞතුකාගාර, තූර්ය වාදක කන්ඩායම්, නාට්‍ය ශාලා හා පොදු රූපවාහිනිය හා ගුවන් විදුලිය සඳහා රාජ්‍ය ආධාර මුදල් තියුනු ලෙස අඩු කර දමා තිබේ. බොහෝ පොදු පාසල්වලට ආධාර මුලුමනින් ම කපා දමා ඇත. පුස්තකාල විවෘතව තබන කාලය සහ සේවාවන් කපා දමා තිබේ. මෙවන් මුදලට යට වූ, ග්‍රාම්‍ය ප්‍රවිෂ්ටයක් නිසා සමාජයේ බුද්ධිමය හා සදාචාරාත්මක පදනම්වලට සිදු වී තිබෙන විනාශය නො මිනිය හැකි වේ. එහෙත් යුදවාදය, මෘග බව සහ ආත්මෝත්තමවාදය උත්කර්ෂනය කිරීම සහ පෙර කල පරම්පරාවන්හි කලාත්මක හා සංස්කෘතික උරුමයට විරුද්ධ වීම අතර පුරුකක් අවිවාදයෙන් ම පවතී.

ලලිත කලාවන් සඳහා ද ජනකායගේ සෑම කොටසකට ම සංගීතයට, නර්තනයට, නාට්‍යයන්ට හා කලාවට, නො මිලේ හෝ නාමික මිලක් ගෙවා සහභාගි වීමට හැකි වන පරිදි නව පාසල් හා කේන්ද්‍රයන් නිර්මානය කිරීම සඳහා ද දැවැන්ත මුදල් සම්භාරයක් වෙන් කල යුතු ය. කලා සඳහා ආධාර මුදල් ගෙවීම පිලිබඳ තීන්දු දේශපාලකයන් අතින් ඉවත් කොට කලාකරුවන්, සංගීතඥයන් සහ අනෙකුත් සංස්කෘතික ක්‍රියාකාරීන් අත තැබිය යුතු ය.

කලාවට ඇති අයිතිය සමග ම පුවත්පතේ නිදහස ද අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය ද පවතී. ඒවා ද දැවැන්ත ලෙස සීමා කරනු ලැබ ඇත. ආන්ඩුවට ද මහා ජාවාරම්වලට ද අවශ්‍ය ප්‍රචාරක සේවය ලෙස ඉතා පිලිකුල් සහගත ක්‍රියා කලාපයක් සංගත-පාලිත මාධ්‍යයන් විසින් ඉටු කරනු ලැබ තිබේ. දැවැන්ත සංගතයන් විසින් එන්නඑන්න ම වැඩි වන ආකාරයට තම ඒකාධිකාරය යටතට ගනුලැබ ඇති ගුවන් විදුලි හා රූපවාහිනී මාධ්‍යයන් ද ප්‍රධාන පුවත්පත් ද දැන් බොහෝ කලකට පෙර, ආන්ඩුවේ හා මහසංගත ප්‍රභූවේ ඒකාධිකාරය විසින් කරනු ලබන කටයුතු

විවේචනාත්මක පරීක්ෂනයකට බඳුන් කලා වූ ''හතර වන වංශය'' ලෙස තමන්ට තිබුනු සම්පූර්න අයිතිය ම අත හැර දැම්මේ ය. ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් සඳහා දැනුගත් මහ ජනතාවක් අවශ්‍ය ය යන ආප්තය ඇත්තකි. සංස්ථාපිතයේ මාධ්‍යයන් විසින් වමාරනු ලබන ක්‍රමානුකූල තොරතුරු විකෘතිය ප්‍රජාතන්ත්‍ර අයිතීන්ට වල කැපීමේ ලා ප්‍රමුඛ ක්‍රියා කලාපයක් ඉටු කරයි. මහ ධනකුවේර අපරාධකරුවන්ට පුවත්පත් ද ගුවන්ගත මාධ්‍ය ද පාලනය කිරීමට තිබෙන හැකියාව, මිනිසුන් දැන ගත යුතු නො ගත යුතු කරුනුකාරනා මොනවා ද යන්න පිලිබඳව අන පැනවීමට ඔවුන් තහවුරු කර ගෙන තිබෙන හැකියාව ''පුවත්පත් නිදහස'' ය යි හැඳින්වීම සමාජවාදී සමානතා පක්ෂය ප්‍රතික්ෂේප කරයි. පසුගාමී හා ප්‍රතිගාමී අගති මතයන් මගින් මහජනතාවගේ සිත් දූෂ්‍ය කිරීමට ඔවුන්ට ඉඩ දිය යුතු නැත. මාධ්‍ය ඒකාධිකාරයන් කැබලි කර ඒවා පොදුජන අයිතිය හා පාලනය යටතට පත් කල යුතු ය යි ද ප්‍රතිවිරුද්ධ මතයන්ට ඒවා තුල ප්‍රකාශ වී ගැනීමට ඉඩ දිය යුතු ය යි ද අපි කියා සිටිමු.

මහ පොලොවේ සීමා සහිත සම්පත් හේතු යුක්ත ආකාරයකට වර්ධනය කිරීම සහතික කල හැක්කේ සමාජවාදී ආර්ථික වැඩ පිලිවෙලකට පමනි. ලාභය සොයා ධාවනයට ද පෞද්ගලික ධන සම්පත් එක්රැස් කර ගැනීමට ද සියලු මානව ක්‍රියාකාරිත්වය යටත් කිරීම පාරිසරික ව්‍යසනයක් ලිහා හැරීමට තර්ජනය කර සිටී. මෙම ගැටලුවට හෝ මහා ජන සමාජයේ එන්නඑන්න ම සංකීර්න වන්නා වූ අවශ්‍යතාවන් විසින් ඉස්මතු කරනු ලබන ගැටලුවලට මුහුන දීමට ලාභ ගරන පද්ධතිය අසමත් වීම මානව වර්ගයාගේ චිර පැවැත්මට මරන තර්ජනයක් එල්ල කර සිටී. සමාජවාදී ආර්ථික සැලසුම්කරනය මහ පොලොවේ පරිසරය ආරක්ෂා කිරීම උදෙසා සැබෑ භූගෝල පරිමාන සහයෝගිතාවක් නිර්මානය කිරීම සඳහා අවශ්‍ය කොන්දේසි නිර්මානය කරනු ඇත. මෙහි දී සාකච්ඡාවට භාජන කරනු ලැබ ඇති කුමන සමාජ අයිතිවාසිකමක් වත්, ඒවා සඳහා සටන් වදින පුලුල් හා බලගතු මහා ජන ව්‍යාපාරයක පැන නැගීමෙන් තොරව දිනා ගත නො හැකි ය. සමාජවාදී සමානතා පක්ෂය වැඩ කරන ජනතාවට, ශිෂ්‍යයන්ට, තරුන ජනයාට සහ සවෘත්තිකයන්ට ඉදිරියට'වුත් වඩා හොඳ ලෝකයක් ගොඩ නැගීම සඳහා සටන් වදින ලෙස ආයාචනය කරමින් පතුලේ සිට ම එවන් ව්‍යාපාරයක් ගොඩ නැගීමට 2004 මැතිවරනය යොදා ගැනීමට අපේක්ෂා කරයි.

## ඩිමොක්‍රැටික් පක්ෂයෙන් බිඳී වෙන් වීම උදෙසා

ඇමරිකානු කම්කරු පන්තියේ කේන්ද්‍රීය ඓතිහාසික ගැටලුව බවට පත්ව ඇත්තේ ධනේශ්වර දේශපාලන පක්ෂවලින් බිඳී ගැනීමට අසමත් වීම යි. පිහිටි ද්විපාක්ෂික පද්ධතිය විකල්පයන් පිලිබඳ සපයන්නේ මායාවක් පමනි. ඩිමොක්‍රැටික් සහ රිපබ්ලිකන් පාක්ෂිකයන් අතර කුමන මතභේද පැවතුනත් ඔවුහු ඇමරිකානු ධනවාදයේ සමාජ රාමුව පිලිගෙන ආරක්ෂා කරති. එම රාමුව වනාහි ජීවිතයේ සෑම අංශයක් ම පෞද්ගලික ධනය ද ලාභය සඳහා නිෂ්පාදනය ද විසින් ආධිපත්‍යයට යටත් කරනු ලැබීම යි.

වැඩ කරන ජනතාවට ඡන්දය පාවිච්චි කිරීමේ අයිතිය පවතී. නමුත්, වැඩි වන සමාජ හා නීතිමය බාධා මැද්දේ වුව එය පාවිච්චි කර ගත හැකි නමුත්, ඔවුන්ට තම ඡන්දය දීමට සුදුස්සක් නැත. ආන්ඩුවේ පිලිවෙත් කෙරේ බලපෑමක් කිරීමේ හැකියාවක් ද ඔවුන්ට නැත. මෙම අයිතිවාසිකම් මොනවා ද යනු තීන්දු කරනු ලබන්නේ ආර්ථික ප්‍රභූවේ කා වැටෙන කල්ලි ද එදිරිවාදී උවමනාවන් ද විසිනි. භාවිතයක් වශයෙන් ම කම්කරු පන්තිය දේශපාලන වරම් අහිමි කර දමනු ලැබ සිටී.

1980 ගනන්වල ජාතිකවාදී කැරලි ගැසීම, පලමු වන ලෝක යුද්ධයට පෙර අයිඩබ්ලිව්ඩබ්ලිව් ව්‍යාපාරයේ සටන්කාමී වෘත්තීය සමිති අරගල, 1930 ගනන්වල යෝධ කම්කරු නැගිටීම, 1960 ගනන්වල සිවිල් අයිතිවාසිකම් අරගල හා යුද්ධ විරෝධී ව්‍යාපාරය යනාදි මීට පෙර පැවති සමාජ ව්‍යාපාරවල කේන්ද්‍රීය දුබලකම වූයේ ඒවාට කවර කලෙක වත් ඩිමොක්‍රැටික් පක්ෂයේ දේශපාලන ආධිපත්‍යයෙන් නිදහස් වී ගැනීමට නො හැකි වීම යි. ඒ නිසා කම්කරු පන්තිය ඒ හෝ මේ සමාජ නපුර අඩු කර දැමීම සඳහා සටන් කිරීමට සීමා කර තිබුනි. එනිසා කම්කරු පන්තියට මහසංගත සංස්ථාපිතයට එරෙහිව මහජනතාවගේ අවශ්‍යතාවලට සේවය කෙරෙන පරිදි ඇමරිකානු සමාජය ක්‍රමානුකූලව සංවිධානය කිරීම තම දේශපාලන න්‍යාය පත්‍රයට ඇතුලු කර ගත නො හැකි විය. ෆ්‍රැන්ක්ලින් රූස්වෙල්ට් වැනි ඩිමොක්‍රැටික් පක්ෂයේ ඉතා දුරදිග දක්නා නායකයෝ සමස්තයක් වශයෙන් ලාභ ගරන පද්ධතියට සේවය කිරීම සඳහා එම පද්ධතියේ ඉතා ම නරක ලක්ෂන සමහන් කිරීමට උත්සාහ කලහ. ඔහුගේ නිව් ඩීල් පිලිවෙත ද ඉන් ඉක්බිතිව 1960 ගනන්වල ලින්ඩන් ජොන්සන් යටතේ ඇති කරනු ලැබූ සමාජ සුභ සාධන පියවරයන් ද වෘත්තීය සමිති නිලධරයේ ආධාර ලත් ඩිමොක්‍රැටික් පක්ෂයට ඇමරිකානු ධනවාදයට සෘජු අභියෝගයක් එල්ල කිරීමෙන් කම්කරු පන්තිය වලක්වා ලීමට හැකි කලේ ය.

එහෙත්, පසු ගිය දශක තුන තුල ඇමරිකානු අධිරාජ්‍යවාදයේ භූගෝලීය ආර්ථික තත්වයේ පිරිහීම මහධනපති පක්ෂ දෙකේ ම දරුනු දකුනට මාරුවක් නිර්මානය කර තිබේ. රිපබ්ලිකානුවෝ සමාජ ප්‍රතිගමනයේ න්‍යාය පත්‍රයක් එලි පිට ම වැලඳ ගෙන සිටිති. අතීත සමාජ සුභසාධන -- ප්‍රතිසංස්කරන සියල්ල විනාශ කිරීමක් ඔවුහු ඉල්ලා සිටිති. ඩිමොක්‍රැටිකයෝ ලිබරල්වාදී සමාජ ප්‍රතිසංස්කරන පිලිබඳ සියලු පිලිවෙත් අත හැර දමා වචනයන්ටත්

වඩා ක්‍රියාවෙන් රිපබ්ලිකානුවන්ගේ පන්ති යුද්ධ පිලිවෙතට අනුගත වී සිටිති. ඇමරිකාවේ මුලු මහත් පරපුරක් ම 1960 ගනන්වල දී අන්තිමට සිදු කරන ලද බරපතල සමාජ ප්‍රතිසංස්කරනයන්ගෙන් පසුව වැඩී මෝරා ගොස් සිටිති. ලින්ඩන් ජොන්සන් (ජනාධිපතිවරයා) ධනපති පර්යායට සමාජ දරිද්‍රය අවසන් කල හැකි ය යන ප්‍රස්තුතය මත පදනම්ව දරිද්‍රතාවට එරෙහිව සිය යුද්ධය ප්‍රකාශ කර දැනට අවුරුදු 40ක් ගත වී තිබේ. අද පෙර කවර කලෙකටත් වඩා ඇමරිකානු ධනවාදය පොහොසත් ය. එහෙත්, 1965 සිටියාට වඩා වැඩි මිනිස්සු සංඛ්‍යාවක් දිලිඳුකමේ ගැලී සිටිති. ක්ලින්ටන් පාලනාධිකාරයේ වාර්තාව ඩිමොක්‍රැටික් පාක්ෂික ''ලිබරල්වාදයේ'' බංකොලොත්කම විදහා දක්වයි. බුෂ් පාලනාධිකාරයේ ප්‍රතිගාමී පිලිවෙත් බොහොමයකට පදනම දැම්මේ ක්ලින්ටන් පාලනය යි: එය පොරොන්දු වූ සෞඛ්‍ය සේවා ප්‍රතිසංස්කරන අත් හැර දැම්මේ ය; සුභසාධන සේවා අහෝසි කර දැම්මේ ය; ප්‍රජාතන්ත්‍ර අයිතීන්ට පහර දුන්නේ ය; සෝමාලියාව, හයිටිය, බොස්නියාව, කොසොවෝව, සුඩානය, ඇෆ්ඝනිස්ථානය සහ ඉරාකය යන ප්‍රදේශවලට යුද්ධමය ආක්‍රමන හා ප්‍රහාර එල්ල කලේ ය. ඉරාකය ආක්‍රමනය කර අල්ලා ගැනීම බිල් ක්ලින්ටන් මෙන් ම හිලරි ක්ලින්ටන් ද යෝජනා කලහ. එක්සත් ජනපදය එම රටින් ඉවත් වීමට ඔවුහු දෙදෙනා ම විරුද්ධ වෙති.

අන්ත-දක්ෂිනාංශික දේශපාලන කෙරුමන් ද විනිසකරුවන් ද ඔවුන්ගේ ස්වාධීන නීතිඥ කෙනත් ස්ටාර් ද විසින් පෙරමුන ගෙන ක්‍රියාත්මක කරන ලද දෝෂාරෝපන කුමන්ත්‍රනයට එරෙහිව බරපතල අරගලයක් කිරීම ප්‍රතික්ෂේප කල ඩිමොක්‍රැටික් පක්ෂය, රිපබ්ලිකානු දකුන විසින් එක්සත් ජනපදයේ පාලනය අත්පත් කර ගැනීමට දොර හැර දුන්නේ ය. මෙම අස්ථායීකරන වැඩ පිලිවෙලට ඉක්බිතිව, 2000 මැතිවරනය, රිපබ්ලිකන් පාක්ෂිකයන් විසින් කොල්ල කෑමට ඩිමොක්‍රැටික් පාක්ෂිකයන් යටත් වීම සහ මහාධිකරනයේ මැදිහත් වීම මගින් සහ ඡන්දයෙන් තෝරා පත් කර නො ගත් ජනාධිපතිවරයෙකු බලයට පත් කිරීම සිදු විය.

2004 මැතිවරන ව්‍යායාමය තිල එක්සත් ජනපද දේශපාලනයේ දක්ෂිනාංශික ගමනේ තවත් අඩියක් සලකුනු කරයි. රිපබ්ලිකන් පක්ෂය තුල දැක ගන්නට ලැබෙන්නේ සංගත ප්‍රභූවේ අතිශයින් ම අසංගත හා කෑදර කොටස්වල ඉහල ම ප්‍රකාශනය යි. ඔවුහු තමන්ගේ ජන සහායේ අරටු පදනම ලෙස මධ්‍යම පන්තියේ ඉතා ම පසුගාමී සහ ප්‍රතිගාමී කොටස්, එනම් ක්‍රිස්තියානි දක්ෂිනාංශය, වාර්ගික අධිපතිවාදීන් සහ සාකල්‍යයෙන් ම ෆැසිස්ට්වාදීන් බලමුලු ගන්වා ගැනීමට යත්න දරති. මෙම කොටස්වල පොදු අරමුන ලෙස පවත්නේ මහා සංගතවලට ලාභ ගරා ගැනීම හා සාමාන්‍ය ජනයා සූරා කෑම සඳහා පවත්නා සකල බාධා ම ඉවත් කර දැමීම ය. කම්කරුවන්ට යම් හෝ යහපතක් සාධනය කරන වෘත්තීය සමිති අයිතිවාසිකම්, පාරිසරික, සෞඛ්‍ය, හා ආරක්ෂන රෙකුලාසි, ජාවාරම් හා උරුම දේපොලවලට යෙදෙන බදු, පැය අටේ ආදායම අනුව ක්‍රමයෙන් ඉහල යන ආදායම් බදු අනුපාතික, සහ පැය අටේ වැඩ දිනය පමනක් නො ව ලාභ ශ්‍රමය සූරා කෑමට පැනවෙන සීමාවන් ද ඉවත් කර දැමීමට ඉලක්ක කර ගෙන ඇත.

ඩිමොක්‍රැටික් පක්ෂයේ අපේක්ෂකයන් ඉඳහිට ජනතාවාදී ඉරියව් දැක්වුව ද ඇමරිකානු ධනවාදයේ ප්‍රධාන පෙලේ ප්‍රධාන දේශපාලන සංස්ථා දෙකින් එකක් ලෙස පවතී. එය මූල්‍ය කතිපයාධිකාරයේ අවශ්‍යතාවලට සේවය කරයි. එම පක්ෂය බුෂ් වෙනුවට ධවල මන්දිරයට පත් වීමට හොඳට ම ඉඩ තිබෙන ඩිමොක්‍රැටික් පාක්ෂික අපේක්ෂකයා නමනියම කර ගැනීම සඳහා බලවත්ව උත්සුක වෙයි.

මුලු මහත් ඡන්ද විමසීම් සන්තතිය ම — දෙපක්ෂයේ අපේක්ෂකයන් තීන්දු කිරීමේ ප්‍රාථමික ඡන්ද විමසීම්වල පටන් ඡන්දය පාවිච්චි කරන දිනය දක්වා විශාල මුදල් සම්භාරයක් විසින් ද මාධ්‍යයන් මගින් ද පාලනය කරනු ලැබේ. ඒවා සෑම අපේක්ෂකයෙකුගේ ම ඉරියව් හා හැසිරීම් බලා ඔවුන් තමන්ට අවශ්‍ය ආකාරයට කසෙන් තලා හැඩ ගස්සා ගනිති. ඒ අතර ම එම මාධ්‍යයෝ මහජන මතය ද හැඩ ගස්සා ගැනීමට වැඩට බැස සිටිති. අන්තිමේ දී ජනාධිපතිවරයෙකු තෝරා ගැනීම පාලක ප්‍රභූව තුල සහමතියක් මිස මහජනතාවගේ ප්‍රජාතන්ත්‍ර අධ්‍යාසය නියෝජනය නො කරයි.

ඩිමොක්‍රැටික් පක්ෂ නායකත්වය තුල ගැටුම් කොතරම් උග්‍ර වුව ද කටුක වුව ද යොමු වී පවතින්නේ සමාජ විරෝධයේ ඉහල නගින උත්සන්න වීමක්, හැකි නම් පූර්ව-භංග කොට හෝ නො හැකි නම් රඳවා සමස්තයක් වශයෙන් ධනේශ්වර පද්ධතියට තර්ජනය නො කරන ආකාරයකට ඇලමංගත කොට දමමින් විෂ හරනයට ලක් කල හැක්කේ කෙසේ ද යන්න උඩ ය. ඔවුන්ට බුෂ් සමග පවත්නා මතභේද කුමක් වුවත්, සියලු ම ඩිමොක්‍රැටික් පාක්ෂික අපේක්ෂකයෝ පාලක පන්තියේ අතිශයින් ම මූලික වූ අවශ්‍යතාවන් පිලිබඳව රිපබ්ලිකානුවන් සමග උරි'නුර පැහැර සිටිති. ඉරාකය ආක්‍රමනය කිරීමට විරුද්ධ වූයේ ය යි කියන්නවුන් විසින් පවා ඇමරිකා එක්සත් ජනපදය ඉරාකය අල්ලා ගෙන සිටීම දිගින්දිගට ම පවත්වා ගෙන යා යුතු ය යි ද ඉරාක ගරිල්ලා හමුදාවේ ප්‍රතිරෝධය පාගා දැමිය යුතු ය යි ද අවධාරනය කෙරෙන්නේ ඒ නිසා ය.

ඩිමොක්‍රැටික් පාක්ෂිකයන්ගේ වාම පාර්ශ්වයේ කුජනතාවාදී (ජනතාවාදී ය යි බොරුවට පෙනී සිටින) කන්ඩායමක් පවතී. ඉන් සමහර කොටස් ඩිමොක්‍රැටික් පක්ෂය ඇතුලත (ඩෙනිස් කුසිනිච් සහ අල් ෂාප්ටන්) වැඩ කරන අතර, හරිත පක්ෂයට හෝ 2000 වර්ෂයේ හරිත පක්ෂයේ ජනාධිපති අපේක්ෂකයා වූ රැල්ෆ් නාඩර්ට සහාය දෙමින් (ඩිමොක්‍රැටික් පක්ෂය අද්දර)

වැඩ කරති. මෙම කොටස් ඩිමොක්‍රැටික් පක්ෂයේ ද සමස්තයක් වශයෙන් ධනේශ්වර දේශපාලන සංස්ථාපිතයේ ද වාම මුක්කුව ලෙස සේවය කරමින් ඩිමොක්‍රැටික් පක්ෂය වමට තල්ලු කල යුතු ය, එසේත් නැත හොත් එය රැඩිකල් දේශපාලන හා සමාජ ප්‍රතිසංස්කරනයේ උපකරනයක් බවට පරිවර්තනය කිරීම පවා සිදු කල හැකි ය යන මිථ්‍යාව පතුරුවති. ඔවුහු ලාභ ගරන පද්ධතිය ආරක්ෂා කරති. කුසිනිච් සම්බන්ධයෙන් ගත හොත් විවෘතව ම වෘත්තීය සමිති නිලධරයේ ද ඇමරිකානු ධනේශ්වරයේ වඩාත් පසුගාමී හා ජාත්‍යන්තර තරගයේ දී අසමර්ථ වූ කොටස්වල ද ආර්ථික ජාතිකවාදය වැලඳ ගනිති.

අල් ෂාප්ටන් විසින් ඉදිරිපත් කරනු ලබන වර්ගවාදී දේශපාලනය කම්කරු පන්තියේ අවශ්‍යතාවන්ට අතිමූලික වශයෙන් සතුරු ය යි ද ධනවාදයට එරෙහිව මහා ජන ජාත්‍යන්තර ව්‍යාපාරයක් ගොඩ නැගීමට පවත්නා අවශ්‍යතාවට සතුරු ය යි ද සැලකිල්ලට ගන්නා සමාජවාදී සමානතා පක්ෂය, එම දේශපාලනයට විරුද්ධ වේ. කල්ලන් අතර, ලැටිනෝ (ස්පාඤ්ඤ බස කතා කරන) හෝ වෙනත් මොන යම් මැ ජන වාර්ගික කන්ඩායමක් අතර හෝ වුව වාර්ගික ඡන්ද දායකත්වයක් දේශපාලනිකව නියෝජනය කරන්නේ ය යි කියන අය අනිවාර්යයෙන් ම තමන්ට තැනක් හා විශේෂ වාසි අපේක්ෂා කරන්නා වූ ස්තරයන් නියෝජනය කරති. 'අනන්‍යතා දේශපාලනයේ' විවිධ අංශ ප්‍රතික්ෂේප කරන අප පක්ෂය සියලු වැඩ කරන ජනතාවගේ සමගිය උදෙසා ස්ථිරසාරව නැගී සිටී.

හරිතයෝ ප්‍රතිගාමී දේශපාලන භූමිකාවක් ඉටු කරති: කම්කරු පන්තිය මත පදනම් වූ ස්වාධීන සමාජවාදී ව්‍යාපාරයක් වර්ධනය කිරීමට විරුද්ධ වෙති. තුන් වන ධනේශ්වර පක්ෂයක් ගොඩ නැගීමට පක්ෂපාතී වෙති. ජර්මනියේ හරිත පක්ෂයේ වාර්තාව විදහා දක්වා ඇති පරිදි, ඔවුහු තමන්ට ජර්මානු දේශපාලනය තුල බලපෑමක් ඇති කර ගැනීමට ඉඩ ලැබුනු වහා ම තමන්ගේ ආරම්භක දේශපාලන රැඩිකල් හැව හරිති. ජර්මානු ග්‍රීන් ව්‍යාපාරයේ හිටපු රැඩිකල්ලු දෙවන ලෝක යුද්ධයෙන් පසු ප්‍රථම වතාවට ජර්මානු හමුදාව පිටරටට යෙදවීමට මග පෑදූහ. කැලිෆෝනියාවේ දී හරිත පක්ෂයේ ආන්ඩුකාර අපේක්ෂකයා වූ පීටර් කමේජෝ දක්ෂිනාංශය විසින් උසි ගැන්වුනු ''ප්‍රත්‍යාලාප'' ව්‍යාපාරයට සහාය දී ප්‍රධාන ඩිමොක්‍රැටික් පාක්ෂික අපේක්ෂක ක්‍රෑස් බස්තමන්තේට පක්ෂව ඡන්දය දිය යුතු ය යි සහයෝගය අඟවන තත්වයකට අන්තිමේ දී එලඹුනි.

2004 ඡන්ද ව්‍යාපාරයේ දී, වමෙන් කතා කරන දේශපාලකයන් යලිත් වරක් මහධනපති පන්තියේ පක්ෂ දෙකෙන් ම කම්කරු පන්තිය දේශපාලනිකව ස්වාධීන කර ගැනීම පිලිබඳ තීරක ප්‍රශ්නය කල් දැමීමට උත්සාහ කරනු ඇත. ඩිමොක්‍රැටික් පක්ෂයේ ජනාධිපති අපේක්ෂක තේරීමේ තරගයේ දී ජය ගන්නා කුමන අපේක්ෂකයා පස්සේ වුව ද බුෂ්ට එරෙහිව පැන නැගී ඇති ජන විරෝධය මෙහෙයවා ලීමට ඔවුන් උත්සාහ කරනු ඇත. ''බුෂ් ඇර වෙන ඕන කෙනෙක්'' යන ආස්ථානයට ඔවුහු සියලු දෙනා ම සහාය දක්වති. හරියට ම ඇමරිකානු ධනවාදයේ එක ම අවිය බුෂ් මෙනි. බුෂ් උපකරන රාශියකින් එකක් බව ඔවුහු නො තකති. එවන් ''අඩු නපුරේ'' සකල දේශපාලනය ම කම්කරු පන්තියට සැබවින් ම එලියට දොරක් නැති පාරකි. අධිරාජ්‍යවාදී යුද්ධයට සහ සමාජ ප්‍රතිගාමිත්වයට විරුද්ධ අරගලයේ දී කෙටි මාවත් නොමැති ය. දැන් අවශ්‍යව පවත්නේ ස්වාධීන, මහජන සමාජවාදී පක්ෂයක් නිර්මානය කිරීම ය. සමාජවාදී සමානතා පක්ෂය 2004 මැතිවරනයට ඉදිරිපත් වන්නේ මෙම අරගලය සඳහා රාමුවක් හා කේන්ද්‍රයක් සම්පාදනය කිරීමට ය.

## සමාජවාදය සහ ඇමරිකානු කම්කරු පන්තිය

සමාජවාදී සමානතා පක්ෂය ජාත්‍යන්තර සමාජවාදී ව්‍යාපාරයේ මහා සම්ප්‍රදාය මත පදනම් වී ගනී. සමාජවාදය නැගී සිටින්නේ සමානතාව, මානව සහයෝගිතාව හා සමුපකාරය, සහ මානව වර්ගයා පීඩනයෙන් හා අගහිඟකමෙන් ද්‍රව්‍යමයව සහ ආධ්‍යාත්මිකව මුදා ගැනීම සඳහා ය. සමාජවාදයේ කර්තව්‍යය නම් දිලිඳු බව නැති කර දැමීම ය — එය වනාහි මානව වර්ගයාගේ නිෂ්පාදන බලවේගයන්ගේ දැවැන්ත වර්ධනය ද විද්‍යාවේ හා තාක්ෂනයේ ඉමහත් ඉදිරි පියවරයන් ද ඇති වී තිබෙන තතු තුල මැනවින් ම සාක්ෂාත් කර ගත හැක්කකි. සමාජවාදය මානව වර්ගයාගේ මහා ජනකායේ ජීවන තත්වයන් ඉහල දමා පූර්න සමානතාව සඳහා කොන්දේසි නිර්මානය කරනු ඇත.

එහෙත්, මිනිසාට හුදු ආහාරයෙන් පමනක් ජීවත් විය නො හැකි ය. සමාජවාදයේ ඉදිරි දර්ශනය ක්ෂනික භෞතික අවශ්‍යතා — ඒවා තීරනාත්මක බව සැබවි — සම්පූර්න කිරීමේ රැඳෙන්නේ නැත. එම ජයග්‍රහනය සංස්කෘතියේ, විද්‍යාවේ, සහ තනිතනි මිනිසුන්ගේ හා ගැහැනුන්ගේ බුද්ධිමය හා සදාචාරමය තත්වයේ යෝධ මල්පල ගැන්වීමකට අත්තිවාරම් දමයි. සමාජවාදය ජනතාවගේ කුසලතා, අවශ්‍යතා සහ විභව ශක්‍යතාවල ශක්‍ය වූ ඉහල ම වර්ධනය අපේක්ෂා කරන්නේ නිෂ්පාදන මාධ්‍යයන්ගේ සමාජ සන්තක භාවය ද, ජාත්‍යන්තර සැලසුම්කරනය හා සමුපකාරය ද, මගින් මහජන සහභාගිත්වය සහ ප්‍රජාතන්ත්‍රවාදී පාලනය දැවැන්තව පුලුල් කිරීමත් මිනිසාට ආර්ථික අවදානමෙන් සහ බලු පොර තරගය විසින් මනුෂ්‍යත්වය නැති කර දමන බලපෑමේ සිත් කලකිරවන බලපෑමෙන් විනිර්මුක්ත කරනු ලැබූ ලෝකයක් තුල ය.

කාල් මාක්ස් එලඹීමත් සමග සමාජවාදය විද්‍යාවක් බවට පත් විය. 1917 ඔක්තෝබර් විප්ලවය මගින් එය ධනවාදය පෙරලා දමා ප්‍රථම කම්කරු රාජ්‍යය වන

සෝවියට් සංගමය පිහිටුවා ලූ මහා ජනතා ව්‍යාපාරයක ක්‍රියා මාර්ගය බවට පත් විය.

රුසියානු විප්ලවය වනාහි සමාජ සමානතාව සඳහා කම්කරු පන්තිය විසින් කරන ලද වඩා පුලුල් අරගලයක කොටසක් විය. ඇමරිකානු කම්කරු පන්තිය ඉදිරියට ගත් සෑම වර්ධනයක් ම සමාජවාදය සමග සම්බන්ධ වූ අතර සමාජවාදී අදහස් දැරූ සටන්කාමීන් විසින් පෙරමුන ගෙන ඉටු කරනු ලැබිනි — පැය අටේ වැඩ දිනය, ළමා ශ්‍රමය වලක්වන නීති, සාර්වත්‍රික පොදු අධ්‍යාපනය, පටන් මහා වෘත්තීය සමිති පිහිටුවීම දක්වා ද දකුනේ ජිම් ක්‍රෝ නීතිය මගින් සිදු කරන ලද ආකාර ජන වර්ග බෙදා වෙන් කිරීමේ නීති අවසන් කිරීම දක්වා ද මෙයට අයත් ය.

බොහෝ ශ්‍රේෂ්ඨ පරමාර්ථයන් මෙන් සමාජවාදය ද අපයෝජනය කර පාවා දෙනු ලැබ ඇත. සෝවියට් සංගමය තුල එය පාවා දෙනු ලැබුවේ ජෝසප් ස්ටාලින් යටතේ පැන නැගුනු නිලධාරි තන්ත්‍රය විසිනි. ස්ටැලින්වාදය වනාහි රුසියානු විප්ලවයේ සමානතාවාදී හා ජාත්‍යන්තරවාදී දායාදය ඉදිරියට ගෙන යාමක් නො වී ය. එය ඊට එරෙහිව සිදු කරන ලද ජාතිකවාදී ප්‍රතිරෝධයක් විය. ස්ටැලින්වාදී නිලධාරිතන්ත්‍රය කම්කරු ප්‍රජාතන්ත්‍රය තලා දැමී ය, සෝවියට් සංගමය මත ඒකාධිපති පාලනයක් ඇටවී ය, සැබෑ මාක්ස්වාදීන් විනාශ කර දැම්මේ ය. ලෝකය පුරා කම්කරු පන්තියේ විප්ලවවාදී අරගල කඩාකප්පල් කලේ ය. ඔවුන් මේ සියල්ල කලේ ''සමාජවාදයේ'' නාමයෙනි. ස්ටැලින්වාදීන් විසින් රුසියානු විප්ලවය පාවාදෙනු ලැබීම ක්‍රෙම්ලින නිලධරය ජාත්‍යන්තර අධිරාජ්‍යවාදය සමග හවුල් වී සෝවියට් සංගමය කඩා බිඳ දමා 1990 ගනන්වල ආරම්භය වන විට ධනවාදය පුනස්ථාපනය කිරීම තුල මස්තකප්‍රාප්ත විය.

ඇමරිකා එක්සත් ජනපදය තුල කම්කරු පන්තියේ අරගල වෘත්තීය සමිති තුල පැන නැගි නිලධරය විසින් පාවා දෙනු ලැබී ය. නිලධරය ධනේශ්වර පද්ධතිය ආරක්ෂා කලේ ය, කම්කරුවන් ඇමරිකානු මහ ධනපතියන්ට යටත් කලේ ය. ඔවුන් මෙම පාවා දීම ඉටු කලේ ප්‍රධාන වශයෙන් ම ඩිමොක්‍රැටික් පක්ෂය සමග සන්ධානයක් මගිනි. ඒඑෆ්එල්-සීඅයිඕ නිලධරයේ පාවා දීම මගින් වෘත්තීය සමිති මහා සංගත කලමනාකරුවන් සමග අනන්‍ය කර, ඒවා කම්කරු පන්තිය ආරක්ෂා කරනවා වෙනුවට කම්කරු පන්තිය පාගා දැමීම සඳහා උපකරන බවට පරිවර්තනය කලේ ය.

අපේ ව්‍යාපාරය පදනම් වන්නේ කම්කරු පන්තියේ හොඳ ම, ඉතා ම ධෛර්යමත්, සහ දුරදිග දක්නා වූ ද නිලධරයට එරෙහිව සමාජවාදය සඳහා සටන් වැදුනා වූ ද කොටසේ දායාදය මත  ය. මෙම සම්ප්‍රදායේ ශ්‍රේෂ්ඨතම සදේහතාවය වූයේ ස්ටැලින්වාදයේ පාවා දීම්වලට එරෙහිව අරගලයට නායකත්වය දී 1938 දී සමාජවාදී විප්ලවයේ ලෝක පක්ෂය වන හතර වන ජාත්‍යන්තරය ආරම්භ කිරීම මගින් ජාත්‍යන්තර කම්කරු පන්ති ව්‍යාපාරයේ යලි ඉපැදීම ට පදනම දැමූ, රුසියානු විප්ලවයේ නායක ලියොන් ට්‍රොට්ස්කිය.

ඇමරිකාව ද සමාජවාදය සඳහා මහා සටන්කරුවන් නිෂ්පාදනය කර තිබේ — ඔවුහු කම්කරු නිලධාරීන්ට එරෙහිව සටන් කරමින් කම්කරු පන්තියේ නිදහස සඳහා තම දිවිය කැප කලහ. ඔවුන'තර බිග් බිල් හේවුඩ්, ඉයුජින් ඩෙබ්ස්, සහ ජේම්ස් කැනන් වෙති. තමන්ගේ ප්‍රජාතන්ත්‍ර අයිතීන් ආරක්ෂා කිරීමට අද දින අරගලය සංවිධානය කිරීම සඳහා ඇමරිකානු කම්කරුවන් මෙම පෝසත් සමාජවාදී දායාදය අත්පත් කර ගත යුතු ය.

ඇමරිකා එක්සත් ජනපදයේ තරම් අන් කිසි ම රටක පාලක පන්තිය සමාජවාදයට එරෙහිව නිර්දය අරගලයක් දියත් කරන්නේ නැත. උපන් මොහොතේ පටන් සෑම ඇමරිකානුවෙකු ම සමාජවාද විරෝධී ප්‍රචාර ඕසයක ගිල්වනු ලැබේ. මෙය මෙසේ වන්නේ මන්දැයි කම්කරුවන් ප්‍රශ්න කර ගත යුතු වේ. ඔවුන් බිය වන්නේ කුමකට ද? සියලු ම කාර්මික රටවල් අතුරින් ඇමරිකා එක්සත් ජනපදය සමාජ අවශ්‍යතාවන්ට උඩින් ලාභය සහ පුද්ගලික ධනය තැබීම වඩාත් ගැඹුරට කා වැදුනු, ප්‍රාග්ධනය ශ්‍රමය මත්තේ තම පාලනය අතිශයින් ම නිර්දය ආකාරයකට කරන්නා වූ රට බවට පත්ව ඇත්තේ අහම්බයකින් ද?

සමාජයේ අවශ්‍යතාව පෞද්ගලික සම්පත් ඒකරාශි කර ගැනීමට ඉහලින් තැබිය යුතු බව සහජයෙන් ම වටහා ගන්නා සියලු දෙනා ම 2004 බලමුලු ගැන්වී ජනාධිපති තරගයේ දී සමාජවාදී සමානතා පක්ෂයේ ව්‍යායාමයට ක්‍රියාශීලීව සහයෝගය දැක්විය යුතු ය.

## සමාජවාදී සමානතා පක්ෂයේ 2004 ජනාධිපතිවරන ව්‍යායාමයට එක් වී එය ගොඩ නගන්න

වැඩකරන ජනතාව ඔවුන්ගේ ම පන්ති අවශ්‍යතාවන් උදෙසා දේශපාලනිකව සටන් කිරීම ද මහ සංගත-පාලිත ද්වි-පක්ෂ පද්ධතියෙන් එලියට බිඳී ගැනීම ද සංවිධානය කිරීම සඳහා කම්කරු පන්තියේ නව මහජන දේශපාලන පක්ෂයක් ගොඩ නැගීමට මග සකසන්නේ සසපයේ, ව්‍යායාමය ම පමනි. බිල් වෑන් ඕකන්, ජිම් ලෝරන්ස් සහ කොන්ග්‍රස් මන්ඩලය සඳහා ඉදිරිපත්ව සිටින සසප අපේක්ෂකයන් ම පමනි සමාජ අර්බුදයේ ගැඹුර සහ අතිමූලිකභාවයට සමපාත වන්නා වූ ප්‍රජාතන්ත්‍රවාදී හා සමාජවාදී ක්‍රියාමාර්ගයක් මත මැතිවරන ව්‍යායාමයට මැදිහත් වන්නේ.

54 වියැති බිල් වෑන් ඕකන් වනාහී 35 වසරක කාල පරිච්ඡේදයක් ඇමරිකානු සහ ජාත්‍යන්තර කම්කරු ව්‍යාපාරයේ අරගලයෙහි නිරතවූවෙකි; ඔහු *ලෝක සමාජවාදී වෙබ් අඩවියේ* පූර්නකාලීන ලේඛකයෙකි. ඔහු නිව් යෝක් නගරයේ ජීවත් වෙයි. 65 හැවිරිදි ජිම් ලෝරන්ස් විශ්‍රාම ගිය මෝටර් රථ කම්කරුවෙකි. හේ අවුරුදු 30ක් තිස්සේ ඔහයෝ ප්‍රදේශයේ ඩේටන් නගරයේ ජෙනරල් මෝටර්ස් කර්මාන්ත ශාලාවේ වැඩ

කලේ ය. ඔහු යුනයිටඩ් ඔටෝ වර්කර්ස් (එක්සත් මෝටර් කම්කරු) සමිතියේ 696 දරන ලෝකල් ශාඛාවේ සාමාජිකයෙකි. කලින් සමාජවාදී අපේක්ෂකයෙකු ලෙස කොන්ග්‍රස් මන්ඩලයේ අසුනක් සඳහා තරඟ වැදී ඇත.

අපගේ සියලුම සහකරුවන්ට, දේශපාලන විශ්ලේෂනය සඳහා *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* කරා එලඹෙන්නන්ට සහ මහා ජාවාරම්කාර පක්ෂවලට එරෙහිව සමාජවාදී විකල්පයකට සහයෝගය දෙන්නන්ට 2004 සසපයේ නිලවරන ව්‍යායාමයට සහාය දෙන ලෙස කියා සිටිමු. සසප අපේක්ෂකයන් සිය නම් ඡන්ද පත්‍රිකාවලට ඇතුලත් කර ගැනීමේ ව්‍යායාමය දැනටම වැදගත් දේශපාලන සහායක් දිනාගෙන ඇත. එය එසේ කලේ ඡන්ද විමසීමක දී නිලයක් සඳහා තරග වැදීමේ ප්‍රාථමික ප්‍රජාතන්ත්‍ර අයිතිය භාවිතා කිරීමට දැරෙන ප්‍රයත්නයට එරෙහිව පිහිටුවනු ලැබ ඇති ඉමහත් බාධක ජය ගැනීමට කම්කරුවන් ද තරුන ජනයා ද බලමුලුගන්වා ගැනීමට දරන ලද ආයාසය තුල දී ය. සමාජවාදී සමානතා පක්ෂ අපේක්ෂකයන් ප්‍රාන්ත 6කින් ජනාධිපති තරගයට ප්‍රවිශ්ට වීමට ද, තවත් ප්‍රාන්ත තුනක මන්ත්‍රීමන්ඩල අපේක්ෂකයන් පිහිටුවා ලීමට ද, සසප සාමාජිකයෝ හා සහකරුවෝ අත්සන් 30,000කට වැඩි සංඛ්‍යාවක් එකතු කලාහු ය. සසප ජනාධිපති අපේක්ෂකයෝ නිව් ජර්සි, අයෝවා, ඔහයෝ, මිනසෝටා, කොලරාඩෝ සහ වොෂින්ටන් ප්‍රාන්තවල ඡන්ද පත්‍රිකාවලට අපේක්ෂකයන් ලෙසට ඇතුලුවීම සඳහා පෙත්සම් ඉදිරිපත් කර සිටිති. ඡන්ද පත්‍රිකාවලට ඇතුලත් කෙරුනු සෙසු අපේක්ෂකයන් නම් මේන්හි දෙවන කොන්ග්‍රස් මන්ඩල දිස්ත්‍රික්කයේ කාර්ල් කූලි, මිචිගන්හි 15 වන කොන්ග්‍රස් මන්ඩල දිස්ත්‍රික්කයේ ජෙරී වයිට්, සහ ඉලිනොයි ප්‍රාන්තයේ නීතිදායක මන්ඩලයේ 103 කොට්ඨාසයේ ටොම් මැකමන් ය. ඔහයෝහි 1 වන කොට්ඨාසයේ වන සින්සිනාටි හි ඩේවිඩ් ලෝරන්ස් ද, කැලිෆෝර්නියාවේ 29 වන දිස්ත්‍රික්කය වන පසාදෙනාහි ජෝන් බර්ටන් ද යන දෙදෙනා කොන්ග්‍රස් මන්ඩල අසුන් සඳහා ඡන්ද පත්‍රිකාවේ නම ලියා ඡන්දය දිය යුතු අපේක්ෂකයන් ලෙස ඉදිරිපත්ව සිටිති.

අපි අපගේ සහකරුවන් ඉදිරියේ මෙම අභියෝගය තබමු. සසප ව්‍යායාමය ප්‍රසිද්ධ කිරීම සඳහා ප්‍රයත්නයට ඔබ ද එක් වනු මැනවි. සසප අපේක්ෂකයන්ට සහාය ලබා ගැනීමට කටයුතු කරන්න. කම්කරුවන් සහ තරුනයන් අතර දේශපාලන වැඩකටයුතු පවත්වාගෙන යන්න! ඔබගේ වැඩපල තුල පාසල් හා අසල්වැසි පෙදෙස් තුල රැස්වීම් සංවිධානය කරන්න. සසප ව්‍යායාමයට අවධානය දෙන්න. මෙම ප්‍රකාශනය හැකිතාක් පුලුල්ව බෙදාහරින්න. වැඩ කරන ජනතාවගේ නව දේශපාලන පක්ෂය ලෙස සසපය ගොඩ නැගීමට ආධාර කරන්න.

ඩිමොක්‍රැටික් සහ රිපබ්ලිකන් පක්ෂවලට ද අන්‍යොන්‍ය මඩ ගසා ගැනීමේ සහ මාධ්‍යවල මුසා ව්‍යායාමවලට ද මුදල් සම්පාදනය කරන්නා වූ මහ සංගතවල ද සුපිරි-ධනවතුන්ගේ ද, ඩොලර් බිලියන ගනන් මැතිවරන ආධාර මුදල් සමාජවාදී සමානතා පක්ෂයට ඇත්තේ ද නැත; සමාජවාදී සමානතා පක්ෂය ඒවා ඉල්ලන්නේ ද නැත. අප අත්කර ගැනීමට උත්සාහ කරන්නා වූ දෙය — එනම් කම්කරු පන්තියේ පන්ති විඥානය ඔසොවාලීම - ඉටු කර ගත හැක්කේ කම්කරුවන් ද, සවෘත්තිකයන් ද, තරුන ජනයා ද ශිෂ්‍යයන් ද බලමුලු ගන්වමින්, ජනාධිපතිවරනයෙන් ඔබ්බට ගමන් කොට, කම්කරු පන්තියේ පෘථුල සමාජවාදී පක්ෂයක් ගොඩ නැගීම සඳහා පදනම් දැමීම තුලින් පමනි.

අපි මෙම අභියෝගය අපගේ සහකරුවන් ඉදිරියේ තබමු. සසප ව්‍යායාමය ප්‍රසිද්ධ කිරීමේ ප්‍රයත්නයේ දී අප හා එක් වනු මැනවි. එහි අපේක්ෂකයන්ට සහාය දිනා ගනිමින්, වැඩ කරන ජනතාව සහ තරුනයන් අතර දේශපාලන සාකච්ඡා පවත්වමින්, එයට එක්වනු මැනවි. ඔබගේ අසල්වැසි ප්‍රදේශ, වැඩපල හා පාසල්වල සසප ව්‍යායාමයට ඇහුම්කන් දීම සඳහා රැස්වීම් සංවිධානය කරනු. හැකිතාක් පුලුල් ලෙස මෙම මැතිවරන ප්‍රකාශනය බෙදාහරිනු මැනවි. කම්කරු පන්තියේ නව දේශපාලන පක්ෂය ලෙස සසපය ගොඩ නැගීමට ආධාර කරනු.

© www.wsws.org